The Socialist

ශ්‍රී ලංකාවේ හා දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වයේ මාසික ප්‍රකාශනය

භූ දේශපාලනය | න්‍යාය | ඉතිහාසය| පන්ති අරගල



ප්‍රංශයේ මහජන විරෝධතා යුරෝපය පුරා රැව්පිළිරැව් දෙයි

ප්‍රංශයේ සිට යුරෝපය පුරා සහ ඊට ඔබ්බට ජන අරගල සීඝ්‍රයෙන් පැතිර යාම මගින් දැනට දිගහැරෙමින් පවතින ව්‍යාපාරයේ සාරාර්ථ වශයෙන් ගෝලීය වන ස්වභාවය ප්‍රකාශයට පත් වේ. වඩාත් මූලික වශයෙන්, මෙහි මතුවෙමින් පවතින සාමාජීය සහ දේශපාලනික සාරය ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී එකක් නොව, කම්කරු පන්තික සහ සමාජවාදී එකකි. පි.3

බන්ධනාගාරගත කෙරුණු ඥානසාර භික්ෂුව සිවුරු හැරවීම සහ බෞද්ධ ස්වෝත්තමවාදීන්ට ජවිපෙ/ජාජබ ආණ්ඩුව යටත් වීම



මෙබඳු සෑම පියවරක්ම සිංහල-බෞද්ධ ස්වෝත්තමවාදය සමඟ රාජ්‍යයේ ආයතනික බද්ධ වීම ගැඹුරු කරයි. ගමනාන්තය පැහැදිලිය: එනම් බෞද්ධ ධූරාවලිය යනු හුදෙක් වරප්‍රසාද ලත් සමාජ තීරුවක් පමණක් නොව එය රාජ්‍යයේ සම-පාලන අධිකාරියක් වන, නීතියම වාර්ගිකවාදී අරමුණු සඳහා නමනු ලබන රාජ්‍යයක් කරා ගමන් කිරීමයි. පි.7

ලෝකය න්‍යෂ්ටික යුද්ධයක අද්දර ද?

යුරෝපීය අගනගරවල පවතින එකම විවාදය වන්නේ කෙතරම් දුරකට සහ කෙතරම් වේගයෙන් මිලිටරි උත්සන්න කිරීම කරන්නේද යන්නයි. පි.11

බ්‍රසල්ස් හි පැවැත්වුණු යුරෝපීය සංගමයේ සමුළුව: යුරෝපීය බලවතුන් රුසියාවට එරෙහි යුද්ධ ධාවනය තීව්‍ර කරයි

ට්‍රම්ප්, පුටින් සමඟ ඇති කරගන්නා එකඟතාවයකින් තමන්ගේම යුද්ධ අරමුණු සහ නැගෙනහිර යුරෝපය මත පවතින බලපෑම අඩපණ විය හැකි බවට යුරෝපීය බලවතුන් බිය වෙති. පි.14

යුද්ධයට එරෙහි මහජන විරෝධය නොතකා ට්‍රම්ප් ඉරානයට එරෙහිව නව ප්‍රහාරයකට සූදානම් වෙයි පි.16

තරුණයින්ගේ සහ “කහ කබාකාරයින්ගේ” දැවැන්ත බලමුලු ගැන්වීම ප්‍රංශ රජය සොලවයි පි.19

දිවුලපතාන ඉඩම් ආරවුල: වාර්ගික ගැටුමක් නොව පන්තිමය ප්‍රශ්නයකි

දෙමළ ජනතාවට තම ජාතිකත්වය (nationality) නිසාම පමණක් ඉඩම් පිළිබඳ පූර්ණ අයිතිය හිමි වන බව ප්‍රකාශ කිරීම වැරදිය. මාක්ස්වාදී ස්ථාවරය නිශ්චිත ය: දෙමළ ගව පාලකයන්ට තම පශු සම්පත සඳහා සාම්ප්‍රදායිකව භාවිතා කළ ඉඩම් සඳහා අනුලංඝනීය ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ඇති නමුත්, එය භාවිතයේ සහ ඓතිහාසික වාස භූමියේ අයිතියක් (habitation) මිස ජනවාර්ගිකත්වයෙන් ගලන බහිෂ්කාරක/ අනන්‍ය වූ හිමිකාරිත්වයේ අයිතියක් නොවේ. ඉඩම් ප්‍රශ්නය ජනවාර්ගික කෝණයකින් විසඳිය නොහැක. පි.22

The Socialist

THEORETICAL ORGAN OF THE SOCIALIST LEAD OF SRI LANKA AND SOUTH ASIA



ONE YEAR OF THE SOCIALIST

THE MONTHLY MAGAZINE

ONE YEAR OF REVOLUTIONARY MARXIST EDUCATION

Advancing the struggle for socialist internationalism.
Building the revolutionary leadership of the working class.



DEFENDING TROTSKYISM. ADVANCING SOCIALIST INTERNATIONALISM.

Building the revolutionary leadership of the working class
in Sri Lanka and South Asia as part of the world socialist revolution.

OCTOBER 2025 – OCTOBER 2026

SOCIALIST LEAD OF SRI LANKA AND SOUTH ASIA (SLLA)

theSocialist.lk

ප්‍රංශයේ මහජන විරෝධතා යුරෝපය පුරා රැව්පිළිරැව් දෙයි



පැරිසියේ පාසැල්වල දරිද්‍රතා අධ්‍යාපන කොන්දේසිවලට එරෙහිව එක්රැස් වූ විරෝධතාකරුවෝ පොලිසියට මුහුණ දේ. *2026* ඔක්තෝබර් *22* බ්‍රහස්පතින්දා. *[AP Photo/Teresa Suarez]*

ඇලෙක්ස් ලැන්ටියර් විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* ඔක්තෝම්බර් *22* දින *"The mass protests in France are reverberating throughout Europe"* යන හිසින් පළවූ ඇලෙක්ස් ලැන්ටියර් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

මීට මාසයකට පෙර, ප්‍රංශයේ දිවිනීතික පාසල් වටලා වසා දැමීමේ ව්‍යාපාරයක් ආරම්භ විය. එය ප්‍රංශ ආණ්ඩුව දැඩි ලෙස සොලවා තැබීමට පමණක් නොව, යුරෝපය පුරා පැතිර යාමට ද සමත් විය. සෑම යුරෝපීය රටකම තරුණයින් සහ කම්කරුවන් එකම ඉල්ලීම් ඉදිරිපත් කරද්දී සහ සෑම තැනකම ආණ්ඩු ඊට පොලිස් ප්‍රචණ්ඩත්වය සහ මර්දනයෙන් පිළිතුරු දෙද්දී, ජාත්‍යන්තර ව්‍යාපාරයක් ගොඩනැගෙමින් පවතී.

මහාද්වීපය පුරා විප්ලවවාදී නැගී සිටීම් සිදු වූ 1848 වර්ෂයේ සිදුවීම්වල ප්‍රතිරාවයක් වර්තමාන සිදුවීම් තුළ දක්නට ලැබේ. මෙය නිසැකවම සාදෘශ්‍යයක්න්(analogy) මිස සංයුක්ත සංසන්දනයක් නොවේ. 2026 ලෝකය 1848 ලෝකයට වඩා බෙහෙවින් වෙනස් ය. නමුත් ප්‍රංශයේ සිට යුරෝපය පුරා සහ ඊට ඔබ්බට ජන අරගල සීඝ්‍රයෙන් පැතිර යාම මගින් දැනට දිගහැරෙමින් පවතින ව්‍යාපාරයේ සාරාර්ථ වශයෙන් ගෝලීය වන ස්වභාවය ප්‍රකාශයට පත් වේ. **වඩාත් මූලික වශයෙන්, මෙහි මතුවෙමින් පවතින සාමාජීය සහ දේශපාලනික සාරය ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී එකක් නොව, කම්කරු පන්තික සහ සමාජවාදී එකකි.**

පසුගිය මාසය තුළ යුරෝපය පුරා මිලියන සංඛ්‍යාත ජනතාවක් පොදුවේ දරන, නමුත් නිල දේශපාලනය විසින් දිගු කලක් තිස්සේ මර්දනය කර තිබූ අදහස් මතුපිටට පැමිණ ඇත. අධ්‍යාපනය, විශ්‍රාම වැටුප් සහ සාමාජීය සුභසාධන වියදම් වලින් යුරෝ බිලියන සිය ගණනක් හමුදාවට සහ යුක්‍රේනයේ රුසියාවට එරෙහි යුද්ධයට යොමු කිරීමටත්; නිවාස හා බලශක්ති මිල ඉහළ නංවන මූල්‍ය සමපේක්ෂනයන්ටත් (financial speculation); **මූල්‍ය වෙළඳපොළවල් මගින් තීරණය කරනු ලබන සාමාජීය කප්පාදු වලටත්;** පොලිස් මර්දනයට සහ නව-ෆැසිස්ට්වාදය ප්‍රවර්ධනය කිරීමටත් එරෙහිව දැඩි විරෝධයක් පවතී. මේවා ජාත්‍යන්තර ගැටලු වන අතර, ඒවා වෙනුවෙන් කෙරෙන අරගල ජාතික සීමා ඉක්මවා පුළුල් සහයෝගයක් දිනාගෙන ඇත.

බඳාදා ග්‍රීසියේ, ඇතැන්ස්හි 20,000 කට ආසන්න පිරිසක් ඇතුළුව, නගර 50 කට වැඩි සංඛ්‍යාවක සිසුහු, ගුරුවරු සහ රාජ්‍ය අංශයේ කම්කරුවෝ පාගමනින් ගමන් කළහ. ඔවුහු අඩු වේතන, රාජ්‍ය අධ්‍යාපනයේ තත්ත්වය සහ දැරිය නොහැකි ශිෂ්‍ය නිවාස මිල

ගණන්වලට එරෙහිව විරෝධය පළ කළ අතර, ප්‍රංශයේ ජන අරගල දෙසට අවධානය යොමු කළහ. ඇතැන්ස්හි තිබූ බැනරයක **"ග්‍රීසියේ සිට ප්‍රංශය දක්වා, අධ්‍යාපනයට මුදල් ලබා දෙනු"** ලෙස සඳහන් වූ අතර ඇතැන්ස්, තෙසලෝනිකි (Thessaloniki) සහ පට්‍රාස් (Patras) යන නගරවල විරෝධතාකරුවන්ගේ කූඩාරම්වල **"ග්‍රීසියේ සහ ප්‍රංශයේ, සැමතැනම කැරලි ගසනු—එකම ගැටලු, එකම සතුරා"** යන සටන් පාඨය සටහන් වී තිබුණි. වෘත්තීය සමිති නායකත්වය නොවැම්බර් 25 තෙක් නැවත රට පුරා වැඩවර්ජනයක් කැඳවා නොමැත.

ඉතාලියේ, ශිෂ්‍ය කණ්ඩායම් ප්‍රංශය සමඟ සහයෝගය ප්‍රකාශ කරමින් මහා විරෝධතා සංවිධානය කර ඇත. 'Rete degli studenti' ජාලය ප්‍රංශ වැඩවර්ජකයින් වෙත ආයාචනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේ: **"අපි ඔබ සමඟ සිටිමු. අපි ඔවුන්ගේ යුද්ධ හැර යන්නෙමු. ආයුධවලට නොව පාසල්වලට මුදල් ලබා දෙනු"** යන්නයි. ඔක්තෝබර් 16 වන දින, රට පුරා නගරවල සිසුහු පාගමනින් ගමන් කරමින්, **"නත්ත්වය වෙනස් නොවන්නේ නම්, ප්‍රංශයේ කළ දේම අපිත් කරන්නෙමු"** යනුවෙන් හඬ නැගූහ. ඉතාලිය, ප්‍රංශය, ග්‍රීසිය, තුර්කිය, මොරොක්කෝව සහ බාස්ක් කලාපයේ (Basque Country) වරාය කම්කරු වෘත්තීය සමිති විසින් ඔක්තෝබර් 30 වන දින යුද්ධයට සහ වරායවල් මිලිටරිකරණය කිරීමට එරෙහිව ජාත්‍යන්තර ක්‍රියාකාරී දිනයක් කැඳවා ඇත. 'CGIL' වෘත්තීය සමිති සම්මේලනය නොවැම්බර් 20 වන දින සඳහා එක්දින රට පුරා වැඩවර්ජනයක් ප්‍රකාශයට පත් කර ඇත.

ප්‍රංශයේ පාසල් විරෝධතා, ලිඒජ් (Liège) සහ බ්‍රසල්ස් (Brussels) හි අධ්‍යාපන වියදම් ඉහළ යාමට එරෙහිව බෙල්ජියම් සිසුන්ගේ සහයෝගිතා විරෝධතාවලට ඉක්මනින්ම මග පෑදීය. මේවා සිදුවූයේ බෙල්ජියම් ආණ්ඩුවේ සමාජ වියදම් කප්පාදු (austerity) සහ හමුදා වියදම් ඉහළ නැංවීමේ ප්‍රතිපත්තිවලට එරෙහිව රට පුරා පැවැත්වෙන දීර්ඝකාලීන විරෝධතා සහ වැඩවර්ජන මාලාවක් අතරතුරදී ය. මෑතකදී, එනම් ඔක්තෝබර් 9 වන දින බ්‍රසල්ස්හි ජාතික උද්ඝෝෂණයක් සහ ඔක්තෝබර් 12 වන දින රාජ්‍ය අංශයේ වැඩවර්ජනයක් ද පැවැත්විණි.

ප්‍රංශ ශිෂ්‍ය ව්‍යාපාරයට සමාන්තරව නගර 50 කට වැඩි ගණනක සිය දහස් ගණන් ජනතාවගේ සහභාගීත්වයෙන් මහා නිවාස විරෝධතා ඇවිලී ගිය ස්පාඤ්ඤයේ, විරෝධතාකරුවෝ ප්‍රංශ විරෝධතාවලට තමුන්ගේ සහයෝගීතාව නැවත නැවතත් ප්‍රකාශ කර සිටිති. ස්පාඤ්ඤයේ නගර චතුරශ්‍ර අත්පත් කරගෙන සිටින විරෝධතාකරුවන්ගේ නැවත නැවතත් කියැවෙන පාඨය වන්නේ **"අපි ප්‍රංශ ජාතිකයන්ගෙන් ඉගෙන ගත යුතුය"** යන්නයි. නොවැම්බර් 11 වන දින සඳහා එක්දින දිවයින පුරා වැඩවර්ජනයක් කැඳවා ඇත.

"හමුදා බඳවා ගැනීම, සිවිල් සේවය සහ යුද්ධය එපා" සහ **"පොහොසතුන්ට යුද්ධය අවශ්‍යයි, තරුණයින්ට අනාගතයක් අවශ්‍යයි"** වැනි සටන් පාඨ භාවිතා කරමින් ජර්මනියේ, නගර 130 කට වැඩි ගණනක "හමුදාවට බඳවා ගැනීමට එරෙහි පාසල් වැඩවර්ජනය" ව්‍යාපාරය තුළ දස දහස් සංඛ්‍යාත තරුණයෝ සක්‍රියව සිටිති. බර්ලිනයේ 'Französisches Gymnasium' පාසල සිසුන් විසින් වටලනු ලැබූ අතර, **"ප්‍රංශයේ සිට ජර්මනියට ගිනි පුපුර පැන්නීමට"** කැඳවුම් කරන පත්‍රිකා හමු වූ බව පොලිසිය ප්‍රකාශ කළේය. ඔක්තෝබර් 20 වන දින මියුනිච් හි පැවැති පාසල් වැඩවර්ජනයෙන් පසුව, ඔක්තෝබර් අග භාගයේදී ජර්මානු නගර කිහිපයක හමුදාවට බඳවා ගැනීමට එරෙහිව තවත් විරෝධතා කැඳවා ඇත.

මෙම රටවලට අමතරව, පෘතුගාලය, අයර්ලන්තය සහ ඇල්බේනියාව යන රටවල ද වැඩවර්ජන හෝ තරුණ විරෝධතා ක්‍රියාත්මක වෙමින් පවතී.

යුරෝපය පුරා තරුණයින් සහ කම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ජාතික මට්ටමින්, ධනපති ආණ්ඩු මගින් ඉහළින් ලබා දෙන ප්‍රතිසංස්කරණ මගින් දිනාගත නොහැක. පාලක පන්තිය සහන දීමට කැමති ද නැත, ඊට හැකියාවක් ද නැත. **මූල්‍ය කනිපයාධිකාරය විසින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයන් සමඟ පැහෙන්නේ නැති තරම් විශාල ධන ඒකරාශී කිරීමක් සිදුකර ඇත.**

ප්‍රංශය, ඉතාලිය, බෙල්ජියම සහ ග්‍රීසිය යන රටවල් දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) සියයට 100 කට වඩා වැඩි රාජ්‍ය ණය ප්‍රමාණයක් දරන අතර ස්පාඤ්ඤයේ ණය ප්‍රමාණය ද ඊට ආසන්නය. **ණයහිමියන්ගේ පීඩනයට ලක්වෙමින් සහ තම ණයවලට එරෙහි මූල්‍ය සමපේක්ෂනයන්ට මුහුණ දෙමින් සිටින මෙම ආණ්ඩුවලට සාමාජීය සහන සඳහා මුදල් සපයා ගත හැක්කේ කතිපයාධිකාරය මත බදු පැනවීමෙන් පමණි; නමුත් ඔවුහු එය කිරීම ප්‍රතික්ෂේප කරති.**

ඒ වෙනුවට, ඔවුහු සම්පත් යුද්ධය වෙත මුදා හරිමින් සිටිති. පසුගිය මාසය පුරා, වැඩිදුර යුද උත්සන්න කිරීම් නෂ්ටික යුද්ධයකට මග පාදනු ඇතැයි මොස්කව් විසින් කරන ලද අනතුරු ඇඟවීම් නොතකා, යුරෝපීය බලවතුන් රුසියාවට එරෙහි යුද්ධය අවදානම නොතකමින් උත්සන්න කළහ. නේටෝව (NATO) කලිනින්ග්‍රෑඩ් (Kaliningrad) වටලෑමට සූදානම් වෙද්දී, මොස්කව්, ශාන්ත පීටර්ස්බර්ග් සහ අනෙකුත් රුසියානු නගරවලට දැවැන්ත ඩ්‍රෝන ප්‍රහාර එල්ල කිරීම සඳහා ඔවුහු යුක්‍රේන පාලන තන්ත්‍රය සන්නද්ධ කළහ.

ඔවුහු "යුරෝපය ප්‍රතිසන්නද්ධ කිරීමේ" ("ReArm Europe") සැලසුම යටතේ අතිරේක යුරෝ බිලියන 800 ක් දක්වා හමුදා වියදම් සඳහා වෙන් කිරීමට සැලසුම් කරති. තවද ජර්මනිය දැවැන්ත නැවත-සන්නද්ධ වීමේ වැඩසටහනකට මුදල් සැපයීම සඳහා තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිත ණය සීමාවෙන් හමුදා වියදම් නිදහස් කර ඇත. මෙවැනි විශාල මුදලක් එකතු කර ගැනීමට ඔවුන්ට හැකි වන්නේ සාමාජීය සුභසාධන වියදම් තදබල ලෙස කපා හැරීමෙන් පමණි.

යුරෝපයේ සෑම ආණ්ඩුවක්ම මෙම ව්‍යාපාරයට එකම ආකාරයකින් පිළිතුරු දෙන්නේ එබැවිනි. **තම ධනයට අත තැබීමට හෝ තම යුද අරමුණු අතහැර දැමීමට කැමති නැති පාලක පන්තියකට මෙම ප්‍රතිපත්ති පැනවිය හැක්කේ**

ඒකාධිපති පාලන ක්‍රම මගින් පමණි. එය මහජන විරෝධයට පිළිතුරු දෙන්නේ පොලිස්-රාජ්‍ය ක්‍රියාමාර්ග සහ නව-ෆැසිස්ට් බලවේග ප්‍රවර්ධනය කිරීම මගිනි.

මෙය කම්කරු පන්තිය හමුවේ මෙම ගැටලුවල මූලික හේතුව වන ධනපති ක්‍රමයටම එරෙහිව සටන් කිරීමේ කාර්යය මතු කරයි.

ප්‍රංශයේ අර්බුදය පෙන්නුම් කරන්නේ කම්කරුවන්ට සහ තරුණයින්ට ඡන්ද දේශපාලනයේ සහ ධනපති රාජ්‍යය සමඟ කෙරෙන වෘත්තීය සමිති සාකච්ඡාවල රාමුව තුළ මෙම සටන ගෙන යා නොහැකි බවයි. වෘත්තීය සමිති නිලධාරිවාදය සහ **ෂෝන්-ලුක් මෙලොන්ෂොන්** (Jean-Luc Mélenchon) වැනි "ජනතාවාදී" (populist) දේශපාලනඥයන් ආණ්ඩුව පස්සට යනු ඇතැයි යන මෝහය ප්‍රවර්ධනය කරද්දී, ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් (Emmanuel Macron) නිර්දය මූලෝපායක් අනුගමනය කරමින් සිටී. ඔහුගේ ආණ්ඩුව විරෝධතා ව්‍යාපාරයට පිළිතුරු දී ඇත්තේ මහා පරිමාණ අත්අඩංගුවට ගැනීම් සහ සිසුන් දුසිම් ගණනකගේ අතපය අබලන් කළ පොලිස් ප්‍රචණ්ඩත්වය මගිනි.

ඔක්තෝබර් 17 වන දින, ඇමරිකා-නේටෝ යුද්ධ සහ රුසියාවට හා ඉරානයට එරෙහි බලශක්ති තහනම් කිරීම් නිසා ඇති වූ ඉන්ධන සහ ජීවන වියදම් ඉහළ යාමට එරෙහිව, මහා තරුණ ජනකායක් "කහ කබාකාරයන්" (yellow vests) සමඟ පාගමනින් ගමන් කළහ. විරෝධතාව නිසා නගර කිහිපයක කැරලි මර්දන පොලිසිය අඩපණ වූ අතර, අභ්‍යන්තර කටයුතු අමාත්‍ය ලෝරන්ට් නූනෙස් (Laurent Nuñez) "පාලනය ගිලිහී ගිය බවට" පිළිගත්තේය. එතැන් සිට, බලධාරීන් ප්‍රධාන නගර කිහිපයක ඇඳිරි නීතිය පැනවූ අතර, ව්‍යාපාරය ආරම්භ වූ තැන් සිට අත්අඩංගුවට ගත් සංඛ්‍යාව 10,000 ඉක්මවා ඇත.

ඔක්තෝබර් 24 විරෝධතාව සඳහා ආණ්ඩුව හමුදාව යොදවමින් සිටී. 'Operation Sentinelle' හි සෙබළුන් රැකවල් රාජකාරි භාර ගනු ඇති අතර, එම ගින් පොලිසියට සහ පෙන්ඩාර්මිවරුන්ට (gendarmes) GIGN, RAID සහ BRI ප්‍රහාරක ඒකක, සන්නද්ධ රථ, හෙලිකොප්ටර් සහ ජල ප්‍රහාරක රථ සමඟ එකතු වී විරෝධතාකරුවන්ට මුහුණ දීමට ඉඩ සැලසේ. බලකායන් වඩාත් චලනශීලී විය යුතු බව නූනෙස් (Nuñez) පවසන අතර, ඔහු පූර්ව දැනුම්දීමකින් තොරව පවත්වන විරෝධතා තහනම් කිරීම ද සලකා බලමින් සිටී.

රාජ්‍ය නිලධාරීහු මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අත්හිටුවන හදිසි නීති තත්ත්වයක් ගැන සාකච්ඡා කරමින් සිටිති. **ලබන වසරේ ජනාධිපතිවරණයේ මත විමසුම්වලින් ඉදිරියෙන්ම සිටින නව-ෆැසිස්ට්වාදී නැෂනල් රැලි (RN) පක්ෂය,** 2032 වන විට යුරෝ බිලියන 140 ක අයවැය කප්පාදුවක් ඉල්ලා සිටින අතර, එහි සභාපති ජෝර්ඩන් බාර්ඩෙල්ලා (Jordan Bardella) විරෝධතාකරුවන් "අරාජිකත්වයේ වෘත්තිකයන්" ලෙස හෙළා දැක ඇත. දක්ෂිණාංශික ලි රෙපබ්ලිකන්ස් (Les Républicains) පක්ෂයේ ජනාධිපති අපේක්ෂක බෘනෝ රෙටයිලෝ (Bruno Retailleau) LFI පක්ෂය තහනම් කිරීමේ අදහස මතු කර ඇත. 2022 දී එම පක්ෂයේ අපේක්ෂක මෙලොන්ෂොන් ඡන්ද මිලියන 8 කට ආසන්න ප්‍රමාණයක් දිනාගත්තේය.

මේ අතරතුර, CGT නිලධරය නොවැම්බර් 5 වන දින පැවැත්වෙන එක්දින දිවයින පුරා වැඩවර්ජනය තෙක් **වැඩවර්ජන ක්‍රියාමාර්ග කල් දමමින්, තරුණයින් සහ "කහ කබාකාරයන්" හුදකලා කර ඇත.** එදින කම්කරුවන් මහා පරිමාණයෙන් වැඩවර්ජනය කළහොත් මැක්‍රොන් පස්සට යනු ඇතැයි CGT හි ප්‍රධාන ලේකම් සොෆී බිනේ (Sophie Binet) කියා සිටී: "කම්කරුවන් වැඩ කිරීම නැවැත්වූ විට, රට අඩපණ වේ, ආර්ථිකය ඇනිරේ, එවිට අපගේ ඉල්ලීම්වලට සවන් යොමුවනු ඇත."

මෙලොන්ෂොන් ඔහුගේ පැත්තෙන් අදහස් දක්වමින්, මැක්‍රොන් තරුණයන්ගේ ඉල්ලීම්වලට එකඟ වූ පසු විරෝධතා අවසන් විය හැකි බව පවසයි: "අපගේ තරුණයින්ට මෙම සිදුවීම් මාලාවට යහපත් අවසානයක් අවශ්‍ය වේ. ඔවුන්ගේ ඉල්ලීම්වලට සවන් දිය යුතුය." ධනපති පාලනය සුරක්ෂිත කර ගනිමින් 1968 මැයි ප්‍රංශ මහා වැඩවර්ජනය පාවා දී අවසන් කිරීම සාධාරණීකරණය කිරීමට ධනපති රාජ්‍ය සහ ස්ටාලින්වාදී ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂය අතර සීමිත සමාජ සහන සාකච්ඡා වීම තුළින් ආණ්ඩුවට ආභාසය ලබා ගත හැකි බවට ඔහු අනුමාන කරයි.

නමුත් මැක්‍රොන් සූදානම් වන්නේ සම්මුතියකට නොව, ඒකාධිපතිත්වයකට ය. බිනේ සහ **මෙලොන්ෂොන් ජාතිකවාදී මෝහයන් ප්‍රවර්ධනය කරන අතර** යුද්ධයට එරෙහි අරගලය, ධනපති කතිපයාධිකාරියේ දේපළ රාජසන්තක කිරීම හෝ යුරෝපය පුරා පන්ති සටන ඇවිලී යාම ගැන කිසිවක් නොකියති. ඔවුහු ප්‍රංශ කම්කරුවන් සහ තරුණයින් යුරෝපයේ අන් නැනක සිටින ඔවුන්ගේ පන්ති සහෝදර සහෝදරියන්ගෙන් වෙන් කරන අතර පාලක පන්තියේ සැලසුම්වලට එරෙහිව සටන් කිරීමට කිසිදු මගක් ලබා නොදෙති.

ප්‍රංශයේ සමාජවාදී සමානතා පක්ෂය (Parti de l'égalité socialiste – PES) සහ යුරෝපයේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) එහි සහෝදර පක්ෂ, පාසල්, විශ්වවිද්‍යාල, වැඩබිම් සහ ප්‍රදේශ තුළ **ක්‍රියාකාරී කමිටු** (committees of action) ගොඩනැගීමට කැඳවුම් කරයි.

අරගලයේ නිරත කම්කරුවන් සහ තරුණයින් විසින් තේරී පත්කර ගනු ලබන සහ පාලනය කරනු ලබන, වෘත්තීය සමිති නිලධාරිවාදයන්ගෙන් සහ ධනපති පක්ෂවලින් ස්වාධීන වූ මෙම කමිටුවලට, නිලධරය විසින් පනවන ලද කාලසටහන්වලින් තොරව වැඩවර්ජන පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම සඳහා සටන් කළ හැකිය.

ක්‍රියාකාරී කමිටුවල කේන්ද්‍රීය කාර්යයක් වන්නේ දැනට යුරෝපය පුරා ඇවිලෙමින් පවතින අරගල ඒකබද්ධ කිරීමයි. මැක්‍රොන්ගේ පොලිස් රාජ්‍යයට එරෙහිව, ප්‍රංශ කම්කරුවන්ගේ සහ තරුණයන්ගේ ප්‍රබලතම මිත්‍රයින් වන්නේ දැනට

යුරෝපය පුරා අරගලයේ යෙදී සිටින කම්කරුවන් සහ තරුණයින් ය. **ඔවුන්ගේ එකවිට සිදුවන නැගී සිටීම මගින් යුරෝපීය මහා වැඩවර්ජනයක අවශ්‍යතාව මතු කරන අතර, එය සූදානම් කළ හැක්කේ වෘත්තීය සමිති නිලධරයේ ජාතික රාමුව බිඳ දැමීමෙන් පමණි.** හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (ICFI), ක්‍රියාකාරී කමිටුවල ජාත්‍යන්තර කම්කරු සන්ධානය (IWA-RFC) හරහා මෙම කමිටු ජාත්‍යන්තරව සම්බන්ධ කිරීමට සටන් කරයි.

එවැනි කමිටුවලට අධිරාජ්‍යවාදී යුද්ධය නැවැත්වීමේ, නව-ෆැසිස්ට්වාදයේ නැගී සිටීම නතර කිරීමේ සහ ධනපති කතිපයාධිකාරයේ දේපළ රාජසන්තක කිරීම මගින් ණය අර්බුදය විසඳීමේ ව්‍යාපාරයක මධ්‍යස්ථානය බවට පත්විය හැකිය. **එම කතිපයාධිකාරය විසින් ආර්ථිකය සහ රාජ්‍යය පාලනය කරන තාක් කල්, නිසි පාසල්, දැරිය හැකි නිවාස සහ හමුදා සේවා බඳවා ගැනීම් හා යුද්ධය අවසන් කිරීම සඳහා වූ තරුණයින්ගේ ඉල්ලීම් ඉටු කළ නොහැක.** එබැවින් PES සහ එහි සහෝදර පක්ෂ කම්කරු පන්තිය විසින් බලය අත්පත් කර ගැනීම සඳහා සහ යුරෝපීය සංගමය වෙනුවට යුරෝපයේ එක්සත් සමාජවාදී ජනරජයක් පිහිටුවීම සඳහා සටන් කරයි.

[අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි]

මෙම ලිපිය ගැන ප්‍රශ්න තිබේද? Socialism AI වෙතින් අහන්න

ප්‍රංශයේ 1968 මැයි මහා වැඩවර්ජනය යනු හරියටම කුමක්ද, සහ කොමියුනිස්ට් පක්ෂය සහ වෘත්තීය සමිති නිලධාරිවාදය විසින් එය අවසන් කරනු ලැබුවේ කෙසේද?

What exactly is the May 1968 general strike in France, and how was it brought to an end by the Communist Party and union bureaucracy?

ක්‍රියාකාරී කමිටුවල ජාත්‍යන්තර කම්කරු සන්ධානය (International Workers Alliance of Rank-and-File Committees) යනු කුමක්ද, සහ එය විවිධ රටවල් පුරා කෙරෙන අරගල සම්බන්ධ කිරීමට උත්සාහ කරන්නේ කෙසේද?

What is the International Workers Alliance of Rank-and-File Committees, and how does it try to link struggles across different countries?

ප්‍රථමයෙන්ම, යුරෝපීය ආණ්ඩු මූල්‍ය වෙළඳපොළවලට මෙතරම් දැවැන්ත රාජ්‍ය ණයබරිත තත්වයට පත් වූයේ කෙසේද, සහ මෙය සමාජ වියදම් කපා හරින අතරතුර හමුදා අය-වැය ඉහළ නැංවීමට ඔවුන්ට බල කරන්නේ මන්ද?

How did European governments accumulate such massive public debts to financial markets in the first place, and why does this force them to cut social spending while raising military budgets?

තවත් ප්‍රශ්න SocialismAI.com වෙතින් අහන්න






බන්ධනාගාරගත කෙරුණු ඥානසාර භික්ෂුව සිවුරු හැරවීම සහ බෞද්ධ ස්වෝත්තමවාදීන්ට ජවිපෙ/ජාජබ ආණ්ඩුව යටත් වීම

සංජය ජයසේකර විසිනි.

මෙම ලිපිය *"The Prison Disrobing of Bhikku Gnanasara and the Capitulation of the JVP/NPP Government to the Buddhist Chauvinists"* යන නිසින් *theSocialist.lk* හි ඉංග්‍රීසි බසින් *2026* ඔක්තෝම්බර් *10* දින පළ කෙරුණි.



"බුරුමයේ ඝාතකයා" ලෙස හැඳින්වෙන, මුස්ලිම් විරෝධී සහ රෝහින්ග්‍යා විරෝධී *969* සහ *Ma Ba Tha* ව්‍යාපාරවල නායකයා වූ බුරුමයේ අන්ත-දක්ෂිණාංශික භික්ෂුවක් වන අශින් විරාතු *(Ashin Wirathu)* (වමේ) හට *2014* ඔක්තෝබර් මාසයේදී පැවැති බොදු බල සේනා රැලියකට ආරාධනා කළ ගලගොඩ අත්තේ ඥානසාර භික්ෂුව (දකුණේ), "මුළු මහත් දකුණු සහ ගිනිකොනදිග ආසියානු කලාපයම සියලු ආකාරයේ මූලධර්මවාදී ව්‍යාපාර, අන්තවාදයන් සහ සිවිල් හෝ ජාත්‍යන්තර යුද්ධවලින් තොර සන්සුන් කලාපයක් බවට පත් කිරීමට" පොරොන්දු වන ගිවිසුමකට අත්සන් තැබීය—එය ප්‍රායෝගිකව මුස්ලිම්වරුන්ට එරෙහිව කරන ලද යුද ප්‍රකාශ කිරීමකි. ඡායාරූපය: *Colombo Telegraph* අනුග්‍රහයෙනි.

සිමන බන්ධනාගාර රෙගුලාසි යටතේ බොදු බල සේනා (BBS) නායක ගලගොඩ අත්තේ ඥානසාර භික්ෂුවගේ සිවුරු හැරවීම—සහ ඒ සමග මතු වූ සිංහල ස්වෝත්තමවාදී ඝෝෂාව හමුවේ ජවිපේ/ජාජබ ආණ්ඩුව සිදු කළ වේගවත් දේශපාලන යටත් වීම—විසින් දිසානායක පාලන තන්ත්‍රයේ ප්‍රතිගාමී ස්වභාවය අසාමාන්‍ය පැහැදිලි බවකින් හෙළිදරව් කර ඇත. මෙහිදී සිදුව ඇත්තේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ගෞරවය අනතුරට දැමීම නොව, රාජ්‍යය කෙරෙහි සිංහල-බෞද්ධ අධිකාරිය තහවුරු කිරීම සහ එම රාජ්‍යය හරහා දෙමළ හා මුස්ලිම් සුළුතර ජන කොටස් පාලනය කිරීමට පාර කැපීමයි.

වරදකරු කිරීම

භික්ෂුව නැවත අත්අඩංගුවට ගැනීම යනු සිංහල-බෞද්ධ සංස්ථාපිතය වසර ගණනාවක් තිස්සේ මඟහැරීමට උත්සාහ කළ, වරදකරු කිරීමේ තීන්දුව (conviction) නීත්‍යනුකූලව බලාත්මක කිරීමකි. අන්ත දක්ෂිණාංශික, ෆැසිස්ට් බොදු බල සේනා සංවිධානයේ ප්‍රධාන ලේකම් ඥානසාර භික්ෂුව 2016 ජනවාරි මාසයේදී හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ කටයුතුවලට බාධා කිරීම මුල් කරගෙන, අධිකරණයට අපහාස කිරීමේ චෝදනා හතරකට 2016 දී අභියාචනාධිකරණය විසින් වරදකරු කරන ලදී. එම චෝදනා බරපතල විය: භික්ෂුව අවසරයකින් තොරව අධිකරණය ඇමතීම සහ එහි කටයුතුවලට බාධා කිරීම; අධිකරණ නියෝග පිළිනොගන්නා බවත් රටේ නීතිය අනුගමනය නොකළ යුතු බවත් විවෘත අධිකරණයේ ප්‍රකාශ කිරීම; අධිකරණය හමුවේ පැවැති නඩුවක සැකකරුවන් වූ රාජ්‍ය බුද්ධි අංශ නිලධාරීන්ට ඇප ලබා දෙන ලෙස අධිකරණයට බලපෑම් කිරීම; සහ පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරයා "නපුංසක රාජ්‍ය නිලධාරියෙකු" ලෙස හැඳින්වීම ඒ අතර විය. භික්ෂුවට වසර හයක් ඇතුළත ගෙවී යන පරිදි වසර 19 ක බරපතල වැඩ සහිත සිරදඬුවමක් නියම විය. 2018 ඔක්තෝබර් මාසයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විශේෂ අභියාචනා අවසරය ප්‍රතික්ෂේප කිරීමත් සමඟ භික්ෂුවගේ අභියාචනා මාර්ග අවසන් විය.

ජනාධිපති සමාව

ඉන්පසු භික්ෂුව නීතියට ඉහළින් තැබීමට මැදිහත් වූයේ බෞද්ධ සංස්ථාපිතයම විසිනි. 2019 මැයි මාසයේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ඥානසාර භික්ෂුවට පූර්ණ ජනාධිපති සමාව ලබා දුන්නේය—ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ සඳහන් පරිදි මෙම සමාව ලබාගෙන ඇත්තේ සියම් මහා නිකායේ මල්වතු, අස්ගිරි සහ කෝට්ටේ පාර්ශ්වයන්හි මහානායක භික්ෂූන් සහ ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේවරයාගේ සෘජු ඉල්ලීම් මගිනි. මහා සංඝ සංස්ථාපිතයේ නායක භික්ෂූන් 2018 සිටම මෙම වරදකරු වූ

ෆැසිස්ට්වාදියා ඔහුගේ අපරාධවල විපාකවලින් ආරක්ෂා කිරීමට බලපෑම් කරමින් සිටිති. වර්තමාන සිවුරු හැරවීමට එරෙහි හඬගෑම යනු අලුත් මතු වීමක් නොවේ; එය එකම ව්‍යාපාරයේ තවත් දිගුවකි.

අවලංගු කිරීම

2026 සැප්තැම්බර් මාසයේදී — විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (Centre for Policy Alternatives) සහ ආචාර්ය පාකියාසෝති සරවනමුත්තු මෙන්ම අතුරුදහන් වූ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳ වන සන්ධ්‍යා එක්නැලිගොඩ විසින් ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම්වල තීන්දුව දෙමින් — ශ්‍රේෂ්ඨාධිකරණය එම ජනාධිපති සමාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණි සහ අත්තනෝමතික බව ප්‍රකාශ කළේය. සිරිසේන කිසිදු හේතුවක් සටහන් නොකර යාන්ත්‍රිකව කටයුතු කර ඇති බවත්, එමගින් තමාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිත බලය ක්‍රියාත්මක කිරීම අත්හැර දමා ඇති බවත් අධිකරණය තීන්දු කළේය; අධිකරණයේ වචනවලින් කියතොත්, එම සමාව “අත්තනෝමතික, මහජන භාරය සහ ස්වාභාවික යුක්තියේ රීතීන් උල්ලංඝනය කරන, ඔහුගේ බලතල ඉක්මවා ගිය (ultra vires) එකක්” විය. අධිකරණය එම සමාව බලරහිත සහ ශූන්‍ය බව ප්‍රකාශ කරමින්, වරදකරු කිරීම සහ සිරදඬුවම නැවත බලගැන්වීය.

සිවුරු හැරවීම

ස්වෝත්තමවාදී විරෝධතාව ඇවිළවූයේ සම්මත බන්ධනාගාර ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම—එනම් වරදකරු වූ සිරකරුවෙකුගේ සිවුරු හැරවීම සහ ඔහුට සිරකරුවෙකුගේ සාමාන්‍ය ඇඳුම් ඇන්දවීමයි. මහා සංඝ සංස්ථාපිතය, විපක්ෂ දේශපාලනඥයන් සහ සිංහල ස්වෝත්තමවාදී කොටස් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම වන්නේ සිරගත කරන ලද භික්ෂූන් සාමාන්‍ය නීතියෙන් නිදහස් කළ යුතු බවයි. සිවුරු හැරවීම බන්ධනාගාර පරිපාලනයට නොව, සංඝ සභාවට (ecclesiastical authority) අයත් එකක් බවට කරන ප්‍රකාශයේ සාරය වන්නේ බෞද්ධ භික්ෂූන් අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියට ඉහළින් පිහිටන බවයි—එනම් තම සාමාජිකයන් සම්බන්ධ කාරණාවලදී රාජ්‍ය සංඝයාට යටත් විය යුතු බවයි. ජනාධිපති ලේකම් කාර්යාලයේ හදිසි රැස්වීමක් කැඳවමින්, සිරගත කළ භික්ෂූන්ට සිවුරු දැරීමට ඉඩ සැලසෙන පරිදි නීතිමය සහ බන්ධනාගාර රාමුව සමාලෝචනය කිරීමට නියෝග කරමින් ජනාධිපති දිසානායක වේගයෙන් යටත් වීම මගින් ලබා දෙන්නේ හරියටම මෙම අයිතියයි. එය කිසිදු සාමාන්‍ය සිරකරුවෙකුට භුක්ති විඳීමට නැති වෙනම නීතිමය පහසුකමක් භික්ෂූන් ට ලබා දෙයි.

මෙය හුදකලා සහනයක් නොවේ. බෞද්ධ භික්ෂූන් සාමාන්‍ය නීතිමය ක්‍රියාවලියෙන් පිටත තබමින්, භික්ෂූන් සඳහා වෙනම අධිකරණ පිහිටුවීමට ආණ්ඩුව මීට පෙර දුන් පොරොන්දුවට පසුව මෙය සිදුවේ. **මෙබඳු සෑම පියවර ක්ම සිංහල - බෞද්ධ ස්වෝත්තමවාදය සමඟ රාජ්‍යයේ ආයතනික බද්ධ වීම ගැඹුරු කරයි. ගමනාන්තය පැහැදිලිය: එනම් බෞද්ධ ධුරාවලිය යනු හුදෙක් වරප්‍රසාද ලත් සමාජ තීරුවක් පමණක් නොව එය රාජ්‍යයේ සම-පාලන අධිකාරියක් වන, නීතියම වාර්ගිකවාදී අරමුණු සඳහා නමනු ලබන රාජ්‍යයක් කරා ගමන් කිරීමයි.**

වාර්ගික සුළුතරයන්ට එරෙහි උද්ඝෝෂණය

මෙම වර්ධනයේ වැදගත්කම වටහා ගත හැක්කේ දෙමළ සහ මුස්ලිම් ජනයාට එරෙහිව දැනටමත් දියත් කර ඇති ස්වෝත්තමවාදී උද්ඝෝෂණයේ සන්දර්භය තුළ පමණි. භික්ෂූන් සඳහා විශේෂ නීතිමය වරප්‍රසාද ඉල්ලා සිටින බලවේගයන්ම යනු ජාතික සුළුතරයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට පද්ධතිගත ලෙස ප්‍රහාර එල්ල කළ බලවේගයන්ය.

දෙමළ ජනතාවට එරෙහිව, රජය විසින් “යුද විරුවන් සැමරීම”—එනම් සිවිල් යුද්ධයෙන් මියගිය පිරිස් සිහිපත් කෙරෙන මහවිරු දිනය (Maaveerar Naal)—තහනම් කිරීමට පියවර ගෙන ඇති අතර, තමන්ගේ මියගිය ඥාතීන් සිහිපත් කිරීමට උත්සාහ කළ දෙමළ තරුණයන් අත්අඩංගුවට ගනිමින් සිටියි. දෙමළ ස්මරණයන් මර්දනය කිරීමේ ඉල්ලීම යනු දෙමළ ජනතාවගේ ඓතිහාසික අත්දැකීම් මකා දැමීමේ, ඔවුන්ගේ ශෝකය සහ මතකය අපරාධයක් බවට පත් කිරීමේ ඉල්ලීමකි. පසුගිය මාසයේදී, දෙමළ ජනයාගේ සති දෙකක ස්මරණ කටයුතුවලින් පසුව, 1987 දී උපවාසයක යෙදී මියගිය LTTE සාමාජිකයෙකු වූ තිලීපන්ගේ අලුතින් ස්ථාපිත කරන ලද පිළිරුවක් නල්ලූර් කෝවිල අසල ස්ථානයකින් ආණ්ඩුව විසින් බලහත්කාරයෙන් ඉවත් කරන ලදී. මීට සමාන්තරව, අනුක්‍රමික ආණ්ඩු විසින් සිංහල ජනාවාස සහ හමුදා අත්පත් කරගැනීම් සඳහා භාවිතා කිරීමට කටයුතු කළ උතුරු නැගෙනහිර ඉඩම් වන දෙමළ ජනයාගේ සාම්ප්‍රදායික වාස භූමිය (traditional habitation) කෙරෙහි ඇති ඔවුනට ඇති අයිතියට එරෙහිව ද උද්ඝෝෂණයක් ක්‍රියාත්මක වේ.

මුස්ලිම් ජනයාට එරෙහිව ස්වෝත්තමවාදී උද්ඝෝෂණය පැන නැගී ඇත්තේ මුස්ලිම් ඇඳුම් පැළඳුම්—බුර්කා තහනම සහ ඊට අදාළ උසිගැන්වීම්—සහ මුස්ලිම්වරුන් සිංහල වර්ගයට (race) එරෙහිව කුමන්ත්‍රණය කරන බවට චෝදනා කරන කුමන්ත්‍රණ න්‍යායන් ප්‍රචාරය කිරීමේ ස්වරූපයෙනි. මේවා පරිවාරයේ සිදුවීම් නෙවෙයි; මේවා මහා සංඝයා විසින් රාජ්‍යයෙන් සුඛෝපභෝගය ඉල්ලා සිටින පුද්ගලයාගේම ප්‍රධාන උපක්‍රමයන්ය. ඥානසාර යනු නීතිමය තාක්ෂණික කරුණක පැටලුණු ආගමික චරිතයක් නොවේ. **ඔහු මුස්ලිම් සුළුතරයට එරෙහිව ප්‍රචණ්ඩත්වය උසිගැන්වීම සඳහා තමාගේ වෘත්තීය ජීවිතයම කැප කළ ෆැසිස්ට් ප්‍රකෝපකාරිකයෙකි.** 2014 ජූනි මාසයේදී දර්ගා නගරයේ පැවැති අන්ත දක්ෂිනාංශික, ෆැසිස්ට් BBS සංවිධානයේ ආක්‍රමණශීලී රැලියකදී ඔහු කළ කුපිත කරවන සුලු කතා, අලුත්ගම සහ බේරුවල මුස්ලිම් විරෝධී ප්‍රහාරයන් (pogroms) ඇවිළවීමට හේතු විය. එහිදී ස්වෝත්තමවාදී මැර කල්ලි විසින් මුස්ලිම් නිවාස, ව්‍යාපාර සහ පූජනීය ස්ථානවලට ප්‍රහාර එල්ල කළ අතර, කිහිප දෙනෙකු මියගොස් පවුල් සිය

ගණනක් අවතැන් විය. එකල පැවැති රාජපක්ෂ පාලන තන්ත්‍රය මෙම ෆැසිස්ට් කොටස් සක්‍රියව ආරක්ෂා කර බල ගැන්වූ අතර, රාජ්‍යයේ හවුල්කාරිත්වය සැඟවීම සඳහා මෙම අමානුෂික ක්‍රියා පිළිබඳ මාධ්‍ය වාර්තාකරණය වාරණය කළේය. පසුව, 2018 මාර්තු මුලදී මහනුවර දිගන මුස්ලිම් විරෝධී ප්‍රහාරය ඇවිළවීමටද ඥානසාර මුල් විය.

ත්‍රස්තවාදයට එරෙහිව සටන් කරන බවට කරන ප්‍රකාශයට හාත්පසින්ම වෙනස්ව, ගලගොඩ අත්තේ ඥානසාර සහ සිංහල ස්වෝත්තමවාදීහු එය සක්‍රියව පෝෂණය කළහ—එනම්, 2019 පාස්කු ඉරිදා බෝම්බකරුවන් මෙහෙයවා ගැනීම සඳහා සහරාන් හෂීම් විසින් ආයුධයක් කරගනු ලැබූ මුස්ලිම් විරෝධී ද්වේෂයේ සහ ප්‍රචණ්ඩත්වයේ සාරවත් පස නිර්මාණය කිරීමයි. මෙය හුදෙක් අපගේ විග්‍රහය පමණක් නෙවෙයි; එය රාජ්‍යයේම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේඛනගත සොයාගැනීමයි. පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව (2021) මගින් තහවුරු කළේ ඥානසාර භික්ෂුවගේ කතා "වහබි මතවාදය ඉලක්ක කිරීමෙන් නතර නොවී පොදුවේ මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කිරීම දක්වා ඉදිරියට ගිය බවත්", භික්ෂුවගේ "ඇතැම් ක්‍රියා සහ ප්‍රකාශ මුස්ලිම් තරුණයන් අන්තවාදයට (extremism) යොමු වීමට සහ සහරාන් හා එක්වීමට හේතු වූ බවත්ය". "සහරාන් තමාගේ අරමුණු සඳහා සහයෝගය රැස් කර ගැනීමට භික්ෂුවගේ කතා සහ ක්‍රියා භාවිත කළ බවට සාක්ෂි" මගින් සොයාගත් කොමිෂන් සභාව, ප්‍රහාරයට හේතු පැහැදිලි කරන සහරාන්ගේ අවසාන වීඩියෝව තුළ ඥානසාර භික්ෂුවගේ ක්‍රියාකලාපය සෘජුවම සඳහන් කර ඇති බව නිරීක්ෂණය කළේය. ඥානසාර භික්ෂුවගේ හැසිරීම "මුස්ලිම් තරුණයන්ගේ අන්‍යෝන්‍ය රැඩිකලීකරණයට (reciprocal radicalization) හේතු වූ" බවට නිගමනය කළ කොමිෂන් සභාව, 2013 මහරගම සහ 2014 අලුත්ගම කතාවලට අදාළව ICCPR පනත යටතේ භික්ෂුවට එරෙහිව අපරාධ නඩු පැවරීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස නීතිපතිවරයාට නිර්දේශ කළ අතර, BBS සංවිධානය "ආගමික සහජීවනයට තර්ජනයක් බවත් එය තහනම් කළ යුතු බවත්" ප්‍රකාශ කළේය.

ස්වෝත්තමවාදීහු අන්තවාදයට එරෙහිව සටන් කළේ නැත; ඔවුහු එය පෝෂණය කළහ. ඔවුන්ගේ වාර්ගික ප්‍රහාරයන් (pogroms), කුමන්ත්‍රණ න්‍යායන් සහ මුස්ලිම් සුළුතරය දරුණු ලෙස අමානුෂිකකරණය (dehumanization) කිරීම මගින් බෝම්බකරුවන්ගේ මතවාදය පෝෂණය කළ අත්‍යවශ්‍ය ඉන්ධන සැපයීය. 300 කට ආසන්න පිරිසක් බිලිගත් පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය යනු සාමකාමී සමාජයකට එල්ල වූ බාහිර ප්‍රහාරයක් නෙවෙයි. එය සිංහල-බෞද්ධ සංස්ථාපිතය විසින් වසර ගණනාවක් තිස්සේ වගා කරන ලද ජාතිවාදී විෂෙහි අස්වැන්නයි—ඉන්පසු ඇති වූ මුස්ලිම් විරෝධී මර්දනය තුළ, තමන් විසින්ම ගොදුරු කරගත් ප්‍රජාවට එරෙහි පීඩනය තීව්‍ර කිරීම සඳහා එම සංස්ථාපිතය විසින්ම එය නැවත භාවිත කරන ලදී.

ඥානසාර භික්ෂුව දැනට සිරගතව සිටීම නීතියේ රැහැනට ඔහු හසු වූ පළමු අවස්ථාව නෙවෙයි. 2016 දී කොළඹ දී පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ඉස්ලාම් ආගම සහ මුස්ලිම් ප්‍රජාවට එරෙහිව චේතනාන්විතවම අපහාසාත්මක, කුපිත කරවන සහ ද්වේෂසහගත ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 291B වගන්තිය යටතේ 2024 මාර්තු 28 වන දින කොළඹ මහාධිකරණය විසින් ඥානසාර භික්ෂුව වරදකරු කර, වසර හතරක බරපතල වැඩ සහිත සිරදඬුවමක් සහ දඩයක් නියම කරන ලදී. අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව මත භික්ෂුව නැවත අත්අඩංගුවට ගැනීම යනු ඔහුගේ වාර්ගිකවාදී උසිගැන්වීම් පිළිබඳ දීර්ඝ අපරාධ වාර්තාවක දිගුවකි. ආගමික ද්වේෂය සහ වාර්ගිකවාදී ප්‍රචණ්ඩත්වය උසිගැන්වීමට වරදකරු වූ මෙම පුද්ගලයා වෙනුවෙන් භික්ෂූන් නීතියට ඉහළින් තබන නීතිමය පහසුකමක් බෞද්ධ සංස්ථාපිතය විසින් ඉල්ලා සිටින අතර, දිසානායක ආණ්ඩුව යටත් වී ඇත්තේ මෙම ඉල්ලීමටයි.

සිවුරු හැරවීමේ සිදුවීම හා සම්බන්ධ උද්ඝෝෂණය දැකිය යුත්තේ මෙම යුද්ධයේම තවත් එක් ඉදිරිපෙළක් ලෙසයි. භික්ෂූන් නීතියට ඉහළින් තැබීමේ ඉල්ලීම යනු බෞද්ධ භික්ෂූන් සිංහල ජාතියේ උත්තරීතර අධිකාරිය ලෙස පිළිගැනීමේ—සහ රාජ්‍යය විසින් සුළුතරයන්ට එරෙහිව එම ආධිපත්‍යවාදය (supremacism) බලාත්මක කිරීමේ—ඉල්ලීමයි. එය වාර්ගිකවාදී ප්‍රහාර මෙහෙයවන, පල්ලි හිනි තබන, බුර්කාව තහනම් කරන සහ දෙමළ ජනයාට තමන්ගේ මියගිය අය වෙනුවෙන් ශෝක වීම තහනම් කරන මතවාදයේම නීතිමය ප්‍රකාශනයයි.

ආණ්ඩුව යටත් වූයේ මන්ද?

ආණ්ඩුව යටත් වූ වේගය සියල්ලටම වඩා කරුණු හෙළිදරව් කරන්නකි. දිසානායක ඊට ප්‍රතිරෝධය පෑවේ නැත, නීතිය ඉදිරියේ සමානතාව පිළිබඳ මූලධර්මය ආරක්ෂා කිරීමට උත්සාහ කළේවත් නැත. ඔහු මහා සංඝයා කැඳවා, භික්ෂූන්ගේ ඉල්ලීම්වලට සවන් දී, නීතිය වෙනස් කිරීමට නියෝග කළේය. මෙය තමාගේ දේශපාලන පැවැත්ම රැඳා පවතින්නේ කොතැනදැයි හරියටම දන්නා සහ පෙර නොවූ විරූ ප්‍රමාණයේ ගෝලීය අර්බුදයක සෙවණැල්ල යටතේ තමාගේ ස්ථාවරය ගණනය කරමින් සිටින ආණ්ඩුවක හැසිරීමයි.

ජවිපේ/ජාජබ යනු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් පනවන ලද කප්පාදු පිළිවෙත් (austerity) කෲර ලෙස බලාත්මක කිරීම සඳහා සියලු මැතිවරණ පොරොන්දු අත්හැර දැමූ දක්ෂිණාංශික, අධිරාජ්‍යවාදී ගැති පක්ෂයකි. එය ජීවන තත්ත්වයන් කෙරෙහි දරුණු කප්පාදු පනවා ඇත, ඇමරිකානු අධිරාජ්‍යවාදය සමඟ පෙළගැසී ඇත, සහ තමාගේ න්‍යාය පත්‍රයට එරෙහි වන කම්කරුවන්ට සහ ශිෂ්‍යයන්ට එරෙහිව රාජ්‍ය මර්දනය දියත් කර ඇත. එය පාලනය කරන්නේ බහුතර ජනතාවගේ හිතසුව පිණිස නොවෙයි, එය ඒ බව දනී. එහි මැතිවරණ පදනම කම්කරු පන්තිය නොව, ජවිපේ විසින් තමාගේ ඉතිහාසය පුරා පෝෂණය කරන ලද සිංහල සුළු ධනේශ්වර පන්තිය සහ ස්වෝත්තමවාදී කොටස්ය.

නමුත් ආණ්ඩුවේ ගණනය කිරීම් ජාතික වශයෙන් හුදකලා කර වටහා ගත නොහැක. එය බලාත්මක කරන කප්පාදු ප්‍රතිපත්ති (austerity) යනු දේශීය ප්‍රතිපත්ති තේරීමක් නෙවෙයි; එය ගෝලීය අර්බුදයක දේශීය ප්‍රකාශනයයි. ඉරානයට එරෙහිව ඇමරිකානු-ඊශ්‍රායල ආක්‍රමණශීලී යුද්ධය ඇවිළීම මගින් ගෝලීය ධනපති ක්‍රමයේ ගෝලීය අර්බුදය ගැඹුරු වී ඇති අතර, ඇමරිකා එක්සත් ජනපදය තුළ ඇතුළුව ජාත්‍යන්තර පන්ති අරගලය අතිමහත් ලෙස උග්‍ර වී ඇත.



ජනාධිපති අනුර දිසානායක සැප්තැම්බර් 8 වන බ්‍රහස්පතින්දා පස්වරුවේ ජනාධිපති ලේකම් කාර්යාලයේදී ත්‍රෛනිකාය නියෝජනය කරන මහා සංඝයා සමඟ විශේෂ සාකච්ඡාවකට එක් විය. ඡායාරූපය: ජනාධිපතිවරයාගේ නිල ෆේස්බුක් පිටුවෙන් අනුග්‍රහයෙනි.

යුද්ධය, පශ්චාත්-යුද ආර්ථික ක්‍රමයේ බිඳවැටීම සහ ගැඹුරු වන ගෝලීය ආර්ථික පසුබෑම (recession) මගින් සෑම අධිරාජ්‍යවාදී බලවතෙකුම අර්බුදයේ වන්දිය කම්කරු පන්තිය ලවා ගෙවීමට තල්ලු කරමින් සිටින අතර, එම බර අර්ධ-යටත් විජිත ලෝකයේ කම්කරු-පීඩිත ජනතාව වෙත පටවන මෙවලම වන්නේ IMF ය. ජවිපෙ/ජාපබ විසින් අකුරටම ක්‍රියාත්මක කරනු ලබන කප්පාදු නියෝග යනු මෙම ගෝලීය යුද්ධයේ සහ ආර්ථික තත්ත්වයේ සෘජු ඵලයකි.

ආණ්ඩුවේ ස්ථාවරය මෙතරම් අස්ථාවර කරන්නේ හරියටම මෙයයි. කප්පාදුව පැනවීමට ආණ්ඩුවට බලකරන එම ගෝලීය අර්බුදයම, කම්කරුවන් තමන්ගේ ජීවන තත්ත්වයට එල්ල වන ප්‍රහාරයන්ට මුහුණ දෙන විට—ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ඉන්දියාව ආදී රටවල මෙන්—ජාත්‍යන්තර වශයෙන් පන්ති අරගලයේ නැගීමක්ද නිර්මාණය කරයි. ජාත්‍යන්තර පන්ති අරගලය නැගී එමින් පවතින අතර, ශ්‍රී ලාංකේය කම්කරු පන්තිය එයින් වෙන්වී නැත. ඊට පටහැනිව: ආණ්ඩුව IMF ඉල්ලීම් කෙතරම් කෲර ලෙස බලාත්මක කරන්නේද, දේශීය වශයෙන් මහජන විරෝධය සඳහා වන ශක්‍යතාවද එතරම්ම වැඩි වේ. ගෝලීය අර්බුදයේ බලපෑම යටතේ, දැනට ජනගහනය අතර පැතිර යන මුළාව දුරීභූතවීම (disillusionment) වේගයෙන් පුපුරන සුලු ස්වරූපයක් ගත හැකි බව ආණ්ඩුව දනී.

මහා සංඝයාට යටත් වීම වටහා ගත යුත්තේ මෙම පසුබිම තුළ ය. පන්ති අරගලයේ වර්ධනය වන ශක්‍යතාවට මුහුණ දෙන ආණ්ඩුව, තමාගේ රාජ්‍ය බලය අස්ථාවර වීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා සිංහල-බෞද්ධ ස්වෝත්තමවාදී කොටස් සැනසිය යුතු බව ගණනය කරයි. මෙම මූලෝපායේ අත්‍යවශ්‍ය මෙවලම වන්නේ බෞද්ධ භික්ෂූන් ය: එනම්, ආණ්ඩුව තමාගේ ස්වෝත්තමවාදී ඡන්ද පදනම මෙහෙයවන උපකරණය සහ—පන්ති අරගලයේ මොහොතවල දී—කම්කරු පන්තිය වාර්ගිකවාදී පදනමින් බෙදා වෙන් කරන උපකරණය යි. සමාජ තත්ත්වය කෙතරම් අන්තරායකර වන්නේද, පාලක පන්තියට මෙම ආයුධය එතරම්ම නැතිවම බැරි එකක් ලෙස පෙනී යයි.

මූලික කරුණ මෙයයි. ශ්‍රී ලංකාවේ කම්කරු පන්තිය යනු සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනයාගෙන් සමන්විත එකකි. එහි එකමුතුව, කප්පාදුවට එරෙහිව, IMF ට එරෙහිව, ධනපති ක්‍රමයටම එරෙහිව කෙරෙන ඕනෑම අරගලයක පූර්ව කොන්දේසියයි. ස්වෝත්තමවාදී උද්ඝෝෂණය—දෙමළ ස්මරණයන්ට එරෙහි ප්‍රහාර, මුස්ලිම් විරෝධී උසිගැන්වීම් සහ දැන් බෞද්ධ භික්ෂූන් නීතියට ඉහළින් තැන්පත් කිරීම—යන සියල්ලටම ඇත්තේ එකම අරමුණකි: එනම් එම එකමුතුව වැළැක්වීම, සිංහල කම්කරුවන් තමන්ගේ දෙමළ සහ මුස්ලිම් සහෝදර සහෝදරියන්ට එරෙහිව මෙහෙයවීම, සහ ඒ මගින් ගෝලීය අර්බුදය විසින් කම්කරු පන්තිය අරගලය දෙසට තල්ලු කරන මොහොතේම මුළු පන්තියම නිරායුධ කිරීමයි.

අනතුර

මෙම වර්ධනයේ අනතුරු විශාල වන අතර, ඒවා වර්ධනය වෙමින් පවතී. සිදුවීම් පෙළගැස්මම චෝදනා පත්‍රයකි. දින කිහිපයකට පෙර ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක්—ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණි සමාවක් අවලංගු කළ සහ සමානතාව සඳහා වන මූලික අයිතිවාසිකම සනාථ කළ තීන්දුවක්—බලාත්මක කරමින් සිටි ආණ්ඩුවක්, දැන් එම තීන්දුව එල්ල කෙරුණු බලවේගයන්ටම යටත් වී ඇත. ආණ්ඩුව විසින් සිරගත කරන ලද වරදකරු කරනු ලැබූ ෆැසිස්ට්වාදියාට බන්ධනාගාරය තුළදීත් ඔහුගේ තනතුරේ සිවුර දරා සිටීමට හැකි වන පරිදි නීතිය සංශෝධනය කිරීමට ආණ්ඩුව එකඟ වී ඇත. තමාගේ බලය තහවුරු වන්නේ නම්, එය නොඑළඹෙන එකඟතාවක්, එය අත් නොහරින මූලධර්මයක්, එය දං ගෙඩියට නොදෙන සුළුතර අයිතිවාසිකමක් නොමැත.

තවද මෙම මොහොතේ කාල නිශ්චය අහඹුවක් නෙවෙයි. මෙම යටත් වීම සිදුවන්නේ ගෝලීය අර්බුදය—ඉරානයට එරෙහි අධිරාජ්‍යවාදී යුද්ධය, ගැඹුරු වන ගෝලීය ආර්ථික පසුබෑම, ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රංශය සහ ඉන්දියාව යන රටවල පන්ති අරගලයේ නැගීම ආදියෙන් පෙන්නුම් කෙරෙන අර්බුදය—විසින් IMF කප්පාදුව අකුරටම බලාත්මක කිරීමට ආණ්ඩුව තල්ලු

කරන, සහ ඒ මගින් ශ්‍රී ලාංකේය කම්කරු පන්තිය අරගලය දෙසට තල්ලු කරන මොහොතේමය. **පාලක පන්තිය තමාගේ වාර්ගිකවාදී ආයුධය වෙත යොමු වන්නේ හරියටම මෙබඳු මොහොතවල්වලදී ය. බෞද්ධ භික්ෂූන් යනු ආණ්ඩුව තමාගේ ස්වෝත්තමවාදී පදනම බලමුලු ගන්වන සහ, පන්ති අරගලය තියුණු වන විට සිංහල කම්කරුවන් තමන්ගේ දෙමළ සහ මුස්ලිම් සහෝදර සහෝදරියන්ගෙන් බෙදා වෙන් කිරීමට යොදා ගන්නා උපකරණය යි.** සමාජ තත්ත්වය කෙතරම් අන්තරායකර වන්නේද, මෙම ආයුධය එතරම්ම කෲර ලෙස භාවිත කරනු ඇත.

කම්කරු පන්තිය නිවැරදි නිගමනයට එළඹිය යුතුය. භික්ෂූන් නීතියට ඉහළින් තැබීමේ ඉල්ලීම තුළ කම්කරු පන්තියට කිසිදු සෙතක් නැත. එම ඉල්ලීම යනු වාර්ගිකවාදී ප්‍රතිගාමීත්වයේ ආයුධයක් මිස පීඩිතයන් ආරක්ෂා කිරීමක් නෙවෙයි. කප්පාදුවට මෙන්ම ස්වෝත්තමවාදයට ද ඇති එකම පිළිතුර වන්නේ ආණ්ඩුවට සහ එය සේවය කරන ධනපති ක්‍රමයට එරෙහිව එක්සත් වූ—සිංහල, දෙමළ සහ මුස්ලිම්—කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන මෙහෙයවීමයි. පාලක පන්තිය විසින් දේශපාලන දේහයට අලුත් ශක්තියකින් එන්නත් කරමින් සිටින ස්වෝත්තමවාදී විෂ අවසන් කළ හැක්කේ, සියලු වාර්ගිකවාදී සහ ආගමික පීඩනයන්ගේ භෞතික පදනම අහෝසි කරන සමාජයේ සමාජවාදී පරිවර්තනයකට පමණි.

Kaliningrad, Russia's territory on the Baltic between Poland and Lithuania



Source: OpenStreetMap contributors • Created with Datawrapper

ලෝකය න්‍යෂ්ටික යුද්ධයක අද්දර ද?

ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මණ්ඩලය විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (WSWS) 2026 සැප්තැම්බර් 30 දින *"Is the world on the brink of nuclear war?"* යන හිසින් පළවූ ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

පෝලන්තය සහ ලිතුවේනියාව අතර බෝල්ටික් (Baltic) කලාපයේ පිහිටි රුසියානු භූමියක් වන කාලිනින්ග්‍රාඩ් (Kaliningrad) වටලෑමට නැටෝව (NATO) පියවර ගන්නේ නම්, න්‍යෂ්ටික ආයුධ භාවිතා කිරීමට තමන් සූදානම් බව රුසියාව මේ සතියේ ප්‍රකාශ කළේය. මෙම අනතුරු ඇඟවීම සෙප්තැම්බර් 28 සහ 29 යන දිනවල බෙල්ජියම, බ්‍රිතාන්‍යය සහ අයර්ලන්තය යන රටවල පිහිටි රුසියානු තානාපති කාර්යාල හරහා මෙන්ම නැටෝව වෙත යැවූ රාජ්‍යතාන්ත්‍රික සටහනක් (diplomatic note) මගින් ද නිකුත් කරන ලදී.

නැටෝ සංවිධානය කාලිනින්ග්‍රාඩ්හි "ගුවන් සහ නාවික වටලෑමක්" සඳහා සූදානම් වන බව පවසමින් අයර්ලන්තයේ රුසියානු තානාපති කාර්යාලය මෙසේ ප්‍රකාශ කළේය: "කිසිදු වරදවා වටහාගැනීමක් නිබිය නොහැක — නැටෝ රටවල් කාලිනින්ග්‍රාඩ් කලාපය රටේ සෙසු කොටස්වලින් හුදෙකලා කිරීමට උත්සාහ කළහොත්, තමන්ගේ භූමිය ආරක්ෂා කර ගැනීම සඳහා න්‍යෂ්ටික ආයුධ ඇතුළු සියලු ආයුධ ගබඩාවන් භාවිතා කිරීමට රුසියාව සූදානම් වනු ඇත."

නැටෝ මාධ්‍ය ප්‍රකාශිකා ඇලිසන් හාට් (Allison Hart) අඟහරුවාදා ඊට ප්‍රතිචාර දක්වමින් ප්‍රකාශ කළේ, "නැටෝව යනු ආරක්ෂක සන්ධානයක් (defensive alliance) වන අතර අපගේ කිසිදු ක්‍රියාකාරකමක් හෝ අභ්‍යාසයක් රුසියාවේ කිසිදු කොටසකට තර්ජනයක් එල්ල නොකරයි" යනුවෙනි. තවද ඇය, "බලය භාවිතා කිරීමේ තර්ජනය සහ ඕනෑම වගකීම් විරහිත න්‍යෂ්ටික වාචාලකමක්" (nuclear rhetoric) හෙළා දුටුවාය.

මෙම ප්‍රකාශය මුළුමනින්ම අසත්‍ය වේ, මන්ද නැටෝ සන්ධානය රුසියාව අභ්‍යන්තරයට එල්ල කරන යුක්‍රේන ප්‍රහාර සන්නද්ධ කරමින් සහ මෙහෙයවමින් සිටින බැවිනි. ට්‍රම්ප් පාලනාධිකාරිය විසින් "රුසියාව තුළ පිහිටි තෙල් සහ ගෑස් පහසුකම්වලට ප්‍රහාර එල්ල කිරීමට" කියෙව් (Kiev) පාලනයට උපකාර වන බුද්ධි තොරතුරු සපයනු ඇති බව NBC News 2025 ඔක්තෝබර් මාසයේදී වාර්තා කළේය. ජූලි 30 වන දින යුරෝපීය කොමිසම විසින් "දිගු දුර පෙට් බලගැන්වූ ඩ්‍රෝන යානා" (long-range jet-powered drones) සඳහා වන අරමුදල් ද ඇතුළුව යුරෝ බිලියන 3.47 ක් කියෙව් වෙත ගෙවන ලදී. සැප්තැම්බර් 19-20 රාත්‍රියේ, යුක්‍රේනය විසින් මොස්කව් නගරයට සහ ඊට අවට කලාපයට යුද්ධයේ සිදු කල විශාලතම ඩ්‍රෝන ප්‍රහාරය එල්ල කරන ලදී. අගෝස්තු 28 වන දින, යුක්‍රේන බලකායන් විසින් එංගල්ස් (Engels) ගුවන් හමුදා කඳවුරේ තිබූ, රුසියාවේ න්‍යෂ්ටික බලකායන්ගේ කොටසක් වන 'Tu-95' මූලෝපායික බෝම්බ හෙලන යානයකට (strategic bomber) ප්‍රහාර එල්ල කළේය.

එපමණක් නොව, නැටෝවේ "ක්‍රියාකාරකම් සහ අභ්‍යාස" එල්ල වී ඇත්තේ කාලිනින්ග්‍රාඩ් දෙසටමය. රොයිටර් පුවත් සේවය උපුටා දැක්වූ බටහිර හමුදා මූලාශ්‍රයකට අනුව, අගෝස්තු මැද භාගයේදී නැටෝ ගුවන් යානා දුසිම් ගණනක් මෙම බාහිර භූමිය

(enclave-රටට පිටින් පිහිටි) වටා පූර්ව දැනුම්දීමකින් තොර මෙහෙයුමක නිරත විය. එමගින් එහි රේඩියෝ සහ රේඩාර් මෙන්ම ගුවන් ආරක්ෂක පද්ධති අක්‍රිය කළ හැකි බව එම මෙහෙයුමෙන් පෙන්නුම් කෙරිණි. ජනවාරි මාසයේ සිට, කොඩි වෙනස් කරන හෝ තමන්ගේ ට්‍රාන්ස්පොන්ඩර් (transponders) අක්‍රිය කරන රුසියානු සබඳතා සහිත තෙල් නැව්, බලහත්කාරයෙන් ගොඩවීමට විවෘත, "රාජ්‍යයක් නොමැති නාවික යාත්‍රා" (stateless vessels) ලෙස යුරෝපීය රාජ්‍යයන් 14 ක් විසින් සලකනු ලබන අතර, මාර්තු මාසයේදී ස්වීඩනය විසින් එවැනි එක් යාත්‍රාවක් අත්අඩංගුවට ගන්නා ලදී.

සෙප්තැම්බර් 11 වන දින පෝලන්ත විදේශ අමාත්‍ය රඩොස්ලාව් සිකෝර්ස්කි (Radosław Sikorski), කාලිනින්ග්‍රාඩ් ගැන සඳහන් කරමින් කියා සිටියේ, "එහි හමුදා ඇත්තේම නැති තරම්" බවයි. නැටෝව "අපගේ පාර්ශවයෙන් කොතරම් ආක්‍රමණශීලී ලෙස අභ්‍යාසයන්හි නිරත විය යුතුද යන්, අප කරන්න යන්නේ කුමක්ද පිළිබඳව [පුටින්ට] අවිනිශ්චිතතාවයක් ඇති කල යුතුය" යි ඔහු යෝජනා කළේය. "රුසියාව සමඟ අපගේ ගැටුම යුක්‍රේනයට පමණක් සීමා වූවක් ලෙස අප නොසිතිය යුතුය" යි ද ඔහු තවදුරටත් පැවසීය.

යුරෝපීය බලවතුන් ක්‍රියා කරන්නේ මොස්කව් කරන්නේ හිස් තර්ජනයක් යන උපකල්පනය මත ය. බ්‍රසල්ස් නුවර පැවැති යුරෝ නිව්ස් ආරක්ෂක සහ අභ්‍යවකාශ සමුළුවේදී (Euronews Defense and Space Summit) නැටෝ මහලේකම් මාර්ක් රූටේ (Mark Rutte) බඳාදා මෙසේ ප්‍රකාශ කළේය: "මම මෙය බරපතල ලෙස ගණන් ගන්නේ නැහැ. ... [පුටින්ට] නැටෝවට එරෙහිව කිසි විටෙකත් ජයග්‍රහණය කළ නොහැකි බව කවුරුත් දන්නවා."

මෙහි තර්කනය වන්නේ නොකඩවා සිදුවන යුද උත්සන්නියයි. යුරෝපීය බලවතුන් තමන්ගේ ප්‍රතිපත්තිය යුක්‍රේන ජයග්‍රහණයක් සමඟ ගැටගසා ඇත. "යුද්ධය රුසියාවටම පැමිණෙන බව පුටින්ට දැනෙන්නට සැලැස්විය යුතුය" යි යුරෝපීය සංගමයේ ආරක්ෂක කොමසාරිස් අන්ද්‍රියුස් කුබිලියුස් (Andrius Kubilius) බඳාදා ප්‍රකාශ කළේය.

මේ අතර, යුක්‍රේනයේ හමුදා මය තත්ත්වය පිරිහෙමින් පවතී. ජූලි මාසයේදී එය වළක්වා ගත්තේ රුසියානු බැලස්ටික් මිසයිල (ballistic missiles) 195 න් 29 ක් පමණක් වූ අතර, තමන්ගේ බලශක්ති පද්ධතිය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය ගුවන් ආරක්ෂණ නොමැතිව එය ශීත ඍතුවට ඇතුළු වෙයි. සිදුවන සෑම පසුබැසීමකටම මුහුණ දෙනු ඇත්තේ තවදුරටත් මිලිටරි උත්සන්න කිරීමෙනි: එනම් ගොඩබිම් හමුදා ඇතුළු කිරීම හෝ කාලිනින්ග්‍රාඩ් ඇතුළු නව පෙරමුණු විවෘත කිරීම මගිනි.

මොස්කව් පාලනයට මුහුණ දීමට සිදුව ඇති පරදුව මීට වඩා වැඩි විය නොහැක. ක්‍රිමියාව යනු කළු මුහුදට යම් සේද, කාලිනින්ග්‍රාඩ් බෝල්ටික් කලාපයට එසේමය. එය බෝල්ටික් නාවික බලඇණියේ මූලස්ථානය වන අතර රුසියාවේ න්‍යෂ්ටික අවි දැරිය හැකි 'ඉස්කන්දර්' (Iskander) මිසයිල පිහිටුවා ඇති මධ්‍යස්ථානයයි. ෆින්ලන්තය සහ ස්වීඩනය නැටෝවට එකතු වූ තැන් පටන්, ගොඩබිමෙන් සහ මුහුදෙන් එම සන්ධානය විසින් වට කරනු ලැබ ඇත.

එක් අතකින් බලන කල, මෙම බාහිර භූමිය (exclave) ක්‍රිමියාවට වඩා සංවේදී වේ. 1945 පොට්ස්ඩෑම් සමුළුව මගින් එය සෝවියට් සංගමයට පවරනු ලැබූ තැන් පටන් එහි තත්ත්වය ජාත්‍යන්තරව පිළිගෙන ඇත. කාලිනින්ග්‍රාඩ්ට එරෙහි ක්‍රියාමාර්ගයක් යනු, රුසියානු භූමියක් බවට කිසිදු ආණ්ඩුවක් අභියෝගයට ලක් නොකරන භූමි ප්‍රදේශයකට එල්ල කරන ප්‍රහාරයකි. රුසියාවේ න්‍යෂ්ටික මූලධර්මයට (nuclear doctrine) අනුව, තමන්ගේ භෞමික අඛණ්ඩතාවයට "තීරණාත්මක තර්ජනයක්" එල්ල කරන සම්ප්‍රදායික ආක්‍රමණයකට (conventional aggression) න්‍යෂ්ටික ප්‍රතිචාරයක් දැක්වීමට අවසර ඇත.

නිටපු රුසියානු රාජ්‍යතාන්ත්‍රිකයෙකු සහ විද්‍යාඥ හි වෙසෙන න්‍යෂ්ටික විශ්ලේෂකයෙකු වන නිකොලායි සොකොව් (Nikolai Sokov), බඳාදා ප්‍රකාශයට පත් කරන ලද සම්මුඛ සාකච්ඡාවකදී රොයිටර් පුවත් සේවයට මෙසේ පැවසීය: "ඔවුන් (රුසියාව) බෝල්ටික් මුහුදු වටලෑම ඇතුළු තවත් [හතුරු] ක්‍රියාමාර්ගයන් අපේක්ෂා කරයි — යුරෝපීය ගණන් බැලීමට අනුව එය යුද්ධයක මට්ටමට වඩා යන්තම් මෙපිටින් විය හැකිය, නමුත් ඔවුන්ට [රුසියාවට] මෙය විවෘත යුද්ධයක් වනු ඇත. මම දෙපාර්ශවයේම පරස්පර වැරදි ගණන් බැලීමේ (mutual miscalculation) පිළිබඳ අවදානමක් දකිමි."

රුසියාව වටලෑම "යුරෝපීය ගණන් හැදීමට අනුව යුද්ධයක මට්ටමට වඩා යන්තම් මෙපිටින්" විය හැකිය, නමුත් ජාත්‍යන්තර නීතියට අනුව එය යුද ක්‍රියාවකි. **1974 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද ආක්‍රමණය (aggression) පිළිබඳ අර්ථ නිරූපණයට "වෙනත් රාජ්‍යයක සන්නද්ධ බලකායන් විසින් රාජ්‍යයක වරායන් හෝ වෙරළ තීරයන් වටලෑම" ඇතුළත් වේ.**

පවතින අවදානම් හමුවේ, සාකච්ඡා සඳහා කිසිදු කැඳවුමක් නොමැති වීමත්, විසඳුමක් ගැන කිසිදු කතාබහක් නොමැති වීමත් තිගැස්ම ඇති කරවන්නකි. **යුරෝපීය අගනගරවල පවතින එකම විවාදය වන්නේ කෙතරම් දුරකට සහ කෙතරම් වේගයෙන් මිලිටරි උත්සන්න කිරීම කරන්නේද යන්නයි.**

මෙය වූකලී, ගැඹුරු වන සමාජීය, ආර්ථික සහ දේශපාලන අර්බුදයකින් වෙලී සිටින අධිරාජ්‍යවාදී බලවතුන්ගේ අවධානම් පිළිබඳ නොසැලකිලිමත්කමයි; ඔවුන් එය කොතැනකට ගෙන යන්නේද යන්න ගැන කිසිදු තැකීමක් නොමැතිව යුද්ධය ඉදිරියට තල්ලු කරයි. ධනපති කතිපයාධිකාරය (capitalist oligarchy) වෙනුවෙන් පෙනී සිටින සහ ජාත්‍යන්තර කම්කරු පන්තිය වෙත කිසිදු සැබෑ ආයාචනයක් කිරීමට අසමත් වන පුටින් පාලනය, ඊට පිළිතුරු දෙන්නේ න්‍යෂ්ටික තර්ජනවලිනි.

මෙම වර්ධනයන්ට 1962 සිද්ධීන් සමඟ වන වෙනස කැපී පෙනෙයි. කියුබාවේ පිහිටුවූ සෝවියට් මිසයිල හේතුවෙන් එක්සත් ජනපදය සහ සෝවියට් සංගමය (යුද්ධයේ) මුවවිටම පැමිණි විට, එම අනතුර ප්‍රසිද්ධියේ පිළිගන්නා ලදී. ජනාධිපති ජෝන් එෆ්. කෙනඩි ඔක්තෝබර් 22 වන දින ජාතික රූපවාහිනිය ඔස්සේ මෙම අර්බුදය ප්‍රකාශයට පත් කළ අතර, ඊළඟ සතිය පුරා ලෝකය සෑම වර්ධනයක් දෙසම අවධානයෙන් සිටියේය. කෙනඩි සහ සෝවියට් නායක නිකිටා කෲෂ්චෙව් (Nikita Khrushchev) ලියුම් හුවමාරු කරගත් අතර, ආණ්ඩු දෙකම එහි ප්‍රතිවිපාකවලට බියෙන්, පසුබැසීමට මගක් සොයා ගන්නා තෙක් පසුපස දොරටු (back channels) හරහා සාකච්ඡා කළහ. [මීට හාත්පසින්ම වෙනස්ව] අද දින පිළිගැනීමක් හෝ සාකච්ඡාවක් ඇත්තේම නැත.

අනතුරේ ප්‍රමාණය සහ ඒ පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය අතර විශාල අගාධයක් ඇත. යම් බරපතල වරදක් පවතින බව මිලියන සංඛ්‍යාත ජනතාවකට දැනුනද, තමන්ගේ ආණ්ඩු නෂ්ටික යුද්ධයක් සමඟ සූදුවේ නියැලෙනු ඇතැයි විශ්වාස කිරීමට ඔවුන්ට නොහැක. මාධ්‍ය තුළ මෙම අනතුර ඉදිරිපත් කෙරෙන තාක් දුරට, එය රුසියානුවන්ගේ පැහැදිලි කළ නොහැකි තර්ජනයක්, පුටින්ගේ “නෂ්ටික වාචාලකම” සහ “දෙමුහුන් යුද්ධය” (hybrid warfare) ලෙස පෙන්නුම් කරයි. නැටෝ බලවතුන් කරමින් සිටින දෙයට [රුසියාව] දක්වන ප්‍රතිචාරයක් ලෙස එය කිසි විටෙකත් ඉදිරිපත් නොකෙරේ.

බදාදා සන්ධ්‍යාව වන විටත්, නිව් යෝර්ක් ටයිම්ස් (New York Times) සහ සීඑන්එන් (CNN) මොස්කව්හි අනතුරු ඇඟවීම වාර්තා කර තිබුණේ නැත. මාධ්‍ය තුළ අදහස් දක්වන අය තවදුරටත් මිලිටරි උත්සන්න කිරීම සඳහා තල්ලු කරමින් සිටිති. වොෂින්ටන් පෝස්ට් (Washington Post) පුවත්පත සඳහන් කළේ, “ට්‍රම්ප්ගෙන් නිතුත්වන වඩා හොඳ පණිවිඩය වනු ඇත්තේ, රුසියාව ලිහිල් නොවන්නේ නම්, යුක්‍රේනයට තවත් දේ කිරීමට එක්සත් ජනපදය ඉඩ දෙන බවයි.”

රුසියාවට එරෙහිව ප්‍රමාණවත් තරම් ආක්‍රමණශීලී නොවීම ගැන ඩිමොක්‍රැට්කයින් විසින් එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ට ප්‍රහාර එල්ල කර ඇත. සැප්තැම්බර් 24 වන දින ඩිමොක්‍රැට්ක් සෙනෙට් සභිකයින් 21 දෙනෙකු ප්‍රකාශ කළේ, චීන ජනාධිපති ෂී ජින්පිං සමඟ පැවැති ට්‍රම්ප්ගේ සමුළුවේදී කළ “මිලිටරි උත්සන්න කිරීම ලිහිල් කිරීම සඳහා වන ආයාචනා” මගින්, “වැලැඩිමීර් පුටින්ගේ යුද යන්ත්‍රය පණගන්වා තබන චීන ද්විත්ව භාවිත භාණ්ඩ (dual-use goods) ගැලීම නැවැත්වීමට කිසිවක් සිදු නොවන” බවයි. ඊට අත්සන් තැබූ අයට ඩිමොක්‍රැට්ක් නායක චක් ෂුමර් (Chuck Schumer), එලිසබෙත් වොරන් (Elizabeth Warren) සහ ඇඩම් ෂිෆ් (Adam Schiff) ඇතුළත් විය.

රුසියාවේ දේශසීමා දක්වා පුරා දශක තුනක නැටෝ ව්‍යාප්තිය මඟින් ඇවිලවූ යුක්‍රේන යුද්ධය, සෑම මහද්වීපයකම දියත් කෙරෙමින් පවතින ගෝලීය ආධිපත්‍යය සඳහා වන අරගලයක කොටසකි. යුද්ධයට වසර හතරකට වඩා වැඩි කාලයක් ගතවී ඇති තැන, ජනතාවගෙන් පිටුපසින් අලුත් සහ විනාශකාරී අදියරක් සූදානම් කෙරෙමින් පවතී. මෙහි වන්දිය ගෙවන කම්කරු පන්තිය, මේ පිළිබඳව දැනුවත් කළ යුතුය. නැවත සන්නද්ධ වීම සඳහා අරමුදල් සම්පාදනය කිරීමට රැකියා සහ සමාජ සුභසාධන වැඩසටහන් කප්පාදු කරන ආණ්ඩු, නෂ්ටික යුද්ධයක් බවට පත්විය හැකි යුද්ධයක් කරා රැගෙන යන එම ආණ්ඩුම වේ.

යුද්ධයට එරෙහි සටන, දැනටමත් වර්ධනය වෙමින් පවතින පන්ති අරගලයට සම්බන්ධ කළ යුතුය. පාලක පන්තිය යුද්ධය දෙසට තල්ලු කරමින් සිටින එම අර්බුදයම, රැකියා අහිමි කිරීම්වලට එරෙහිවද, සමාජ සුභසාධන වැඩසටහන් විනාශ කිරීමට එරෙහිවද, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල වන ප්‍රහාරවලට එරෙහිවද කම්කරුවන් අරගලයට තල්ලු කරමින් සිටියි.

එය නැවැත්වීමට සමත් එකම සමාජ බලවේගය කම්කරු පන්තියයි, නමුත් එය කළ හැක්කේ සූදානම් කෙරෙන්නේ කුමක්දැයි වටහාගෙන, යුද්ධයට සහ එය නිර්මාණය කරන ධනපති ක්‍රමයට එරෙහිව දැනුවත්ව අරගල කළහොත් පමණි. පළමු කාර්යය වන්නේ අනතුර පිළිබඳ නිශ්ශබ්දතාවය බිඳ දැමීමයි. මෙම ප්‍රකාශනය හැකි තරම් පුළුල් ලෙස සංසරණය කරන ලෙස අපි අපගේ පාඨකයින්ගෙන් ඉල්ලා සිටිමු.

මෙම ලිපිය ගැන ප්‍රශ්න තිබේද? Socialism AI ගෙන් අසන්න:



What is the historical background to NATO’s eastward expansion since the early 1990s that the article says provoked the Ukraine war?

යුක්‍රේන යුද්ධය ඇවිලවූ බව ලිපියේ සඳහන් වන, 1990 ගණන්වල මුල් භාගයේ සිට නැටෝවේ නැගෙනහිර දෙසට ව්‍යාප්ත වීමේ ඓතිහාසික පසුබිම කුමක්ද?

Can you explain how the Cuban Missile Crisis of 1962 was resolved and why that process of negotiation seems absent today?

1962 කියුබානු මිසයිල අර්බුදය විසඳුනේ කෙසේද සහ එම සාකච්ඡා ක්‍රියාවලිය අද නොමැති බව පෙනෙන්නේ මන්දැයි පැහැදිලි කළ හැකිද?

How does the drive toward war with Russia connect internationally to the austerity and attacks on jobs and social programs that workers face in their own countries?

රුසියාව සමඟ යුද්ධය කරා යන ධාවනය, කම්කරුවන් තම තමන්ගේ රටවල මුහුණ දෙන වියදම් කප්පාදුවලට සහ රැකියා හා සමාජ සුභසාධන වැඩසටහන්වලට එල්ල වන ප්‍රහාරවලට ජාත්‍යන්තරව සම්බන්ධ වන්නේ කෙසේද?

තවත් ප්‍රශ්න SocialismAI.com වෙතින් අසන්න.

බ්‍රසල්ස් හි පැවැත්වුණු යුරෝපීය සංගමයේ සමුළුව: යුරෝපීය බලවතුන් රුසියාවට එරෙහි යුද්ධ ධාවනය තීව්‍ර කරයි



වමේ සිට, යුරෝපීය මණ්ඩලයේ සභාපති අන්තෝනියෝ කොස්ටා *(Antonio Costa)*, යුක්‍රේන ජනාධිපති වොලොඩිමීර් සෙලෙන්ස්කි *(Volodymyr Zelenskyy)* සහ යුරෝපීය කොමිසමේ සභාපති උර්සුලා ෆොන් ඩෙර් ලෙයන් *(Ursula von der Leyen) 2026* ඔක්තෝබර් *16* වන සිකුරාදා බ්‍රසල්ස් හි පැවැත්වුණු *EU* සමුළුව වෙත පැමිණෙති. *[AP* පින්තූරය/ඕමාර් හවානා*]*

යොහානස් ස්ටර්න් විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* ඔක්තෝම්බර් *16* දින ***“EU summit in Brussels: European powers intensify war drive against Russia”*** යන හිසින් පළවූ යොහානස් ස්ටර්න් විසින් ලියන ලද ලිපියේ සිංහල පරිවර්තනය යි.

බ්‍රසල්ස් නුවරදී බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවල පැවැත්වුණු යුරෝපීය සංගමයේ (EU) සමුළුව, ජාත්‍යන්තර යුද්ධ අර්බුදයේ අන්තරායකර උත්සන්න වීම ප්‍රකාශයට පත් කළ තැනක් විය. ට්‍රම්ප් පාලනාධිකාරිය යුරෝපීය බලවතුන් සමඟ පවතින ගැටුම් මධ්‍යයේ, අවම වශයෙන් මේ මොහොතේ හෝ රුසියාව සමඟ යම් එකඟතාවකට පැමිණීමට උත්සාහ කරමින් සිටින අතර, බර්ලිනය ප්‍රමුඛ EU ආණ්ඩු යුක්‍රේන යුද්ධය ඉදිරියට ගෙනයෑමට සහ පුළුල් කිරීමට බලපෑම් කරමින් සිටියි. මූල්‍යමය සහ හමුදාමය බරින් වැඩි කොටසක් තමන්ම දරා ගනිමින් යුරෝපය ස්වාධීන හමුදා බලවතෙකු ලෙස ගොඩනැගීමට ඔවුහු අපේක්ෂා කරති.

න්‍යෂ්ටික යුද්ධයක් ද ඇතුළත්ව, නේටෝ සංවිධානය සහ රුසියාව අතර සෘජු යුද්ධයක් ඇවිලවීමේ තර්ජනය මතු කරන උත්සන්න වීමක් ද මෙයට සමගාමීව සිදු වේ. එමෙන්ම, යළි ආයුධ සන්නද්ධ වීම, “තරඟකාරීන්වය”, වෙළඳ යුද්ධය සහ සංක්‍රමණය පිළිබඳ සමුළුවේදී සිදුවූ සාකච්ඡා මගින් අවධාරණය වන්නේ, විදේශයන්හි ක්‍රියාත්මක වන යුද්ධ ව්‍යාපාරය දේශීයව එල්ල කෙරෙන තීව්‍ර සමාජීය ප්‍රහාරයන්ට සහ අධිකාරීවාදී ක්‍රියාමාර්ගයන්ට වෙන් කළ නොහැකි ලෙස බද්ධ වී ඇති බවයි.

වොෂින්ටනය සහ යුරෝපය අතර ගැටුම්

සමුළුවේ ප්‍රධාන අවධානය යොමු වූයේ යුක්‍රේන ජනාධිපති වොලොඩිමීර් සෙලෙන්ස්කිට ප්‍රකාශිතව සහය දැක්වීම කෙරෙහිය. රුසියානු ඩීසල් සැපයුම් සම්බන්ධයෙන් පුටින් සමඟ ඇති කරගත් එකඟතාවයකින් පසුව, ට්‍රම්ප් සම්බාධක ලිහිල් කළ අතර රුසියානු තෙල් පිරිපහදු වෙත යුක්‍රේනය එල්ල කළ ප්‍රහාර විවේචනය කළේය. යුක්‍රේනයේ නායකත්වයේ වෙනසක් ද ඔහු ඉල්ලා සිටියේය. ඊට පටහැනිව, යුරෝපීය ආණ්ඩු රුසියාවේ බලශක්ති යටිතල පහසුකම්වලට එල්ල කරන ප්‍රහාර තවදුරටත් කරගෙන යාමට සහ

සම්බාධක තද කිරීමට තීරණය කර ඇත.

සිකුරාදා සෙලෙන්ස්කි අසල සිටගනිමින් යුරෝපීය මණ්ඩලයේ සභාපති අන්තෝනියෝ කොස්ටා ප්‍රකාශ කළේ: “දැන් යුක්‍රේනයට දක්වන සහය ආපසු ගැනීමට කාලය නොවේ. දැන් රුසියාවට එරෙහි සම්බාධක ලිහිල් කිරීමට කාලය නොවේ.” ඒ වෙනුවට EU සංවිධානය යුක්‍රේනයට දක්වන සහය සහ රුසියාවට එල්ල කරන බලපෑම වැඩි කළ යුතුය. යුරෝපීය කොමිසමේ සභාපති උර්සුලා ෆොන් ඩෙර් ලෙයන් 22 වන සම්බාධක පැකේජය සඳහා වන සූදානම නිවේදනය කළාය.

ජර්මානු රජය විශේෂයෙන්ම ආක්‍රමණශීලී ස්ථාවරයක් ගනිමින් සිටී. චාන්ස්ලර් ෆ්‍රීඩ්රික් මෙර්ට්ස් (Friedrich Merz) ප්‍රකාශ කළේ යුක්‍රේනයට “ස්ථාවර සහයෝගයක් ලබා දීම” සඳහා EU සංවිධානය කීව් (Kiev) වෙත ලබා දෙන ප්‍රතිපාදන “නැවත වරක් ... වැඩි කළ යුතු” බවයි. “යුරෝපයේ දේශපාලන පටිපාටිය” ආරක්ෂා කිරීම සඳහා එය අවශ්‍ය බව ඔහු පැවසීය. වොෂින්ටනය සමඟ පවතින ගැටුම දැන් යුරෝපයේ අත්හිටුවා ඇති රුසියානු මහ බැංකුවේ යුරෝ බිලියන 210 කට ආසන්න වත්කම් පාලනය කිරීම කෙරෙහි ද යොමු වී ඇත. වාර්තාවලට අනුව, ඇමරිකානු **ගනුදෙනු සාකච්ඡාකරුවන්ට (negotiators) අවශ්‍ය වන්නේ මොස්කව් සමඟ පැවැත්වෙන ගනුදෙනු සාකච්ඡාවලදී මෙම වත්කම්වලින් කොටසක් භාවිත කිරීමටයි. මෙර්ට්ස් එය එකහෙළා ප්‍රතික්ෂේප කළේය: “එය අපගේ කාර්යයක්, ඒ ගැන තීරණය කරන්නේ අපි.”**

මෙම වෙනස්කම් පිටුපස පවතින්නේ ප්‍රතිපක්ෂ භූ-මූලෝපායික සහ ආර්ථික අභිලාෂයන්ය. ට්‍රම්ප්, පුටින් සමඟ ඇති කරගන්නා එකඟතාවයකින් තමන්ගේම යුද අරමුණු සහ නැගෙනහිර යුරෝපය මත පවතින බලපෑම අඩපණ විය හැකි බවට යුරෝපීය බලවතුන් බිය වෙති. ඒ සමගම, යුක්‍රේනයේ යුද ප්‍රයත්නය ඇමරිකානු හමුදා තාක්ෂණය සහ බුද්ධි තොරතුරු සහය මත තවදුරටත් රැඳී පවතී. චන්ද්‍රිකා මත පදනම් වූ ස්ටාර්ෂීල්ඩ් (Starshield) පද්ධතියට පනවා ඇති සීමාවන් පිළිබඳ වාර්තා මගින් මෙම ප්‍රායත්නතාව විශේෂයෙන්ම පැහැදිලි වේ.

යුද්ධය සඳහා තව තවත් බිලියන ගණනින්

සෙලෙන්ස්කි 2027 වසර සඳහා යුක්‍රේනයේ යුද්ධ වියදම යුරෝ බිලියන 155 ක් ලෙස ඉදිරිපත් කළ අතර අතිරේක යුරෝපීය සහය ලෙස අවම වශයෙන් යුරෝ බිලියන 70 ක් ඉල්ලා සිටියේය. මෙම මුදල් මගින් යුක්‍රේනයට දෙගුණයක සිට තෙගුණය දක්වා ඩ්‍රෝන යානා ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමටත්, රුසියාවට එල්ල කරන හමුදාමය බලපෑම දැවැන්ත ලෙස වැඩි කිරීමටත් හැකි වනු ඇත. 2026 සහ 2027 වසර සඳහා යුරෝ බිලියන 90 ක ණය මුදලක් EU සංවිධානය විසින් මේ වන විටත් ක්‍රියාත්මක කර ඇත. බිලියන ගණනක මෙම නව ඉල්ලීම් සම්බන්ධයෙන් බ්‍රසල්ස් හිදී කිසිදු තීරණයකට එළඹුණේ නැත; මූල්‍යකරණ විකල්පයන් සකස් කිරීමේ කාර්යය කොමිසමට පවරා ඇත.

දැනටමත් යොදවා ඇති මුදල් ප්‍රමාණය අතිවිශාලය. ලෝක ආර්ථිකය පිළිබඳ කීල් ආයතනයේ (Kiel Institute for the World Economy) අධ්‍යයනයකට අනුව, ජර්මානු රජය, පොරොන්දු වූ මුදල් ද ඇතුළුව, මේ දක්වා යුක්‍රේනයට ලබා දී ඇති සහය යුරෝ බිලියන 100 කට ආසන්න ලෙස දක්වයි. ආසන්න වශයෙන් යුරෝ බිලියන 41.7 ක් යුක්‍රේනයට ලබා දුන් සෘජු ආධාර ලෙස සටහන් වී ඇති අතර, තවත් යුරෝ බිලියන 22 ක් අනාගත හමුදාමය පොරොන්දු සහ විය හැකි වියදම් ලෙස පවතී. එකතුව ගත් කල මෙය යුරෝ බිලියන 63.7 ක් වන අතර, එයින් යුරෝ බිලියන 56.3 ක්ම හමුදාමය ආධාර වේ. මීට අමතරව, ජර්මනියේ සිටින යුක්‍රේන යුද අනාථයන් සඳහා ප්‍රධානවම යුරෝ බිලියන 35.9 ක් වියදම් කර ඇත. ලේඛනගත කර ඇති සියලුම අයවැය ප්‍රතිපාදන තවම නිදහස් කර නොමැත.

කීල් අධ්‍යයනයේ දේශපාලනික ගම්‍යතාවය කරුණු අනාවරණීය වේ. යුක්‍රේනයට සැබවින්ම ගියේ යුරෝ බිලියන 41.7 ක මුදලක් “පමණක්” බව අවධාරණය කරන සිරස්තලයක් යටතේ, යුද අනාථයන් සඳහා වන වියදම් මගින් “යුක්‍රේන රජයේ ආරක්ෂක ප්‍රයත්නයන්ට සහයක් නොලැබෙන” බව එය පෙන්වා දෙයි. මෙම සසඳා දැක්වීමෙන්ම දේශපාලන නැඹුරුව පැහැදිලි වේ: අනාථයන් සඳහා වන සහන සහ අනෙකුත් සමාජ වියදම් කපා හැරීම් සඳහා බලපෑම වැඩෙමින් පවතින අතර, යුද ප්‍රයත්නය සඳහා තව තවත් විශාල මුදල් ප්‍රමාණයක් යෙදවීමට කටයුතු සංවිධානය කෙරේ. මීට අමතරව ඉදිරි වසරවලදී හමුදා අයවැය වෙත ගලා යාමට නියමිත තවත් බිලියන සිය ගණනක් ද මෙයට එකතු වේ.

නේටෝ-රුසියානු යුද්ධයක් සඳහා වන ප්‍රායෝගික සූදානම්වීම්

සමුළුවට සමාන්තරව, හමුදාමය ගැටුම තීව්‍ර වෙමින් පවතී. යුරෝපයේ නේටෝ උත්තරීතර මිත්‍රපාක්ෂික අණදෙන නිලධාරී ඇලෙක්සස් ග්‍රින්කෙවිච් (Alexus Grynkewich) වෝර්සෝ හිදී ඔහුගේ “ජයග්‍රහණයේ න්‍යාය” (Theory of Victory) ඉදිරිපත් කළේය: “වැළැක්වීම, අඩපණ කිරීම, විනාශ කිරීම” (Block, Blunt, Break). එල්ල විය හැකි ප්‍රහාරයක් පළමුව වළක්වාලීම, පසුව ප්‍රතිපක්ෂ සන්නද්ධ බලකායන් විනාශ කිරීම, සහ අවසානයේදී ඔවුන්ට සහය දක්වන අණදෙන, සැපයුම් සහ නිෂ්පාදන ව්‍යුහයන් අක්‍රිය කිරීම මෙහි අරමුණයි. ග්‍රින්කෙවිච් මෙම උපායමාර්ගය ආරක්ෂාකාරී එකක් ලෙස විස්තර කළද, මහා යුද්ධයකදී සැලසුම් කළ මෙහෙයුම් රුසියානු භූමිය අභ්‍යන්තරයටම විහිදී යා හැකිය. ඔහු ජර්මනිය “නේටෝ සංවිධානයේ එන්ජිම” ලෙස පැසසුමට ලක් කළේය.

ඒ සමගම, ජර්මානු ටොර්නාඩෝ (Tornado) ප්‍රහාරක ජෙට් යානා ද ඇතුළත්ව රටවල් 17 ක සහභාගීත්වයෙන් නේටෝ සංවිධානය මෙම සතියේ ඉතාලියේදී “ස්ටෙඩ්ෆාස්ට් නූන්” (Steadfast Noon) න්‍යෂ්ටික යුද අභ්‍යාසය පැවැත්වීය. නේටෝව මෙය සැබෑ න්‍යෂ්ටික ආයුධ නොමැති සාමාන්‍ය අභ්‍යාසයක් ලෙස විස්තර

කරයි. එහෙත් යුද තත්ත්වය උත්සන්න වීමේ අවදානම ශීඝ්‍රයෙන් වැඩි වන මොහොතක න්‍යෂ්ටික මෙහෙයුම් සඳහා වන ක්‍රියාපටිපාටීන් මෙහිදී පුනුණු කෙරිණි.

නේටෝ සංවිධානයේ අඛණ්ඩ කුපිත කිරීම්වලට රුසියාව පිළිතුරු දෙන්නේ න්‍යෂ්ටික තර්ජන එල්ල කරමිනි. ඔක්තෝබර් මුලදී පුටින් අනතුරු ඇඟවූයේ කලිනින්ග්‍රාඩ් (Kaliningrad) වටලෑමක් සිදු වුවහොත් රුසියාවට තම සම්පූර්ණ අවි ගබඩාවම භාවිත කළ හැකි බවයි. දැන්, රාජ්‍ය ඩූමා (Duma) නියෝජිත ඇලෙක්සි ෂුරාව්ලියොෆ් (Alexei Zhuravlyov) Lenta.ru වෙත පවසා ඇත්තේ, නේටෝ ප්‍රහාරයක් සිදු වුවහොත්, රුසියානු න්‍යෂ්ටික ප්‍රහාරයන් නේටෝ මූලස්ථානය මෙන්ම ජර්මනිය, බෙල්ජියම, ඉතාලිය සහ තුර්කියේ පිහිටි ඇමරිකානු න්‍යෂ්ටික ආයුධ කඳවුරු ඉලක්ක කරගත හැකි බවයි. ෂුරාව්ලියොෆ්ගේ තර්ජනය නිල රජයේ ප්‍රකාශයක් නොවේ. එසේ වුවද, ඔහුගේ අදහස් මගින් රුසියානු පාලක තන්ත්‍රයේ කොටස් යුරෝපයේ න්‍යෂ්ටික යුද්ධයක් ගැන කෙතරම් ප්‍රායෝගිකව සාකච්ඡා කරන්නේද යන්න පෙන්නුම් කරයි.

නේටෝ සංවිධානයේ මූලෝපාය “පූර්වඅංග” (preemptive) ප්‍රහාර සඳහා ආවරණයක් ලෙස සේවය කළ හැකි බවට රුසියානු හමුදා විචාරකයෝ අනතුරු අඟවති. සෝවියට් සංගමයට එරෙහිව හිට්ලර් (Hitler) ගෙන ගිය පූර්ණ විනාශක යුද්ධයට ඔවුහු මෙය සමාන කරති. නාසි ප්‍රචාරණයන් විසින් ද එකල එම යුද්ධය සාධාරණීකරණය කළේ සැලසුම් කර තිබූ බව කියන සෝවියට් ප්‍රහාරයකට එරෙහි “ආරක්ෂාව” ලෙසය.

යුද්ධය සඳහා නේටෝ සංවිධානයේ නිශ්චිත කාලසටහන කුමක් වුවත්, පවතින අන්‍යෝන්‍ය තර්ජන මගින්ම තත්ත්වය පාලනයෙන් තොරව ශීඝ්‍රයෙන් උත්සන්න විය හැකි බව පෙන්නුම් කරයි. කළු මුහුදේ වෙළඳ නැව් වෙත එල්ල වූ ඩ්‍රෝන ප්‍රහාරවලින් පසුව, රොමේනියාව සහ බල්ගේරියාව රුසියාවට එරෙහිව අතිරේක නේටෝ ක්‍රියාමාර්ග ඉල්ලා සිටිති.

යුද්ධයට එරෙහි මහජන විරෝධය නොතකා ට්‍රම්ප් ඉරානයට එරෙහිව නව ප්‍රහාරයකට සූදානම් වෙයි

ඇන්ඩ්‍රේ ඩේමන් විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* ඔක්තෝම්බර් *25* දින *“Trump prepares new onslaught on Iran in defiance of mass opposition to war”* යන හිසින් පළවූ ඇන්ඩ්‍රේ ඩේමන් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

ට්‍රම්ප් සහ නෙතන්යාහු පාලනයන්, නායකයින් දෙදෙනාම ප්‍රධාන මැතිවරණමය පසුබෑම්වලට මුහුණ දෙනු ඇතැයි අපේක්ෂිත මැතිවරණවලට පෙර, ඉරානයට එරෙහිව විශාල නව ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා වන සූදානමක අවසාන අදියරේ පසුවෙති.

ඉරානයට තවත් ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කරන්නේදැයි සෙනසුරාදා විමසූ විට, එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ෆ්ලොරිඩාවේදී මාධ්‍යවේදීන්ට පැවසුවේ, “ඒ ගැන සිතමින් සිටිනවා, සමහර විට හෙට” ලෙසය. ඔහු තවදුරටත් මෙසේ පැවසීය: “සමහර විට මට එය ඉවරයක් කිරීමට සිදුවනු ඇත, නැතහොත් සමහර විට ඔවුන් ගිවිසුමකට පැමිණෙනු ඇත.” ඉරිදා ඔහු Fox News නාලිකාවට පැවසුවේ “අද ප්‍රහාරයක් සිදු නොවනු ඇත” යන්නයි. නමුත් ඔහු තම තේරීම ඉදිරිපත් කළේ එකම ආකාරයකටය: “මා ඔවුන් සමඟ ගිවිසුමකට එළඹෙනවාද, නැතහොත් මා ඔවුන්ව ඉවරම කරලා දානවද ?”

මෙම ප්‍රකාශයන් සිදුවන්නේ නොවැම්බර් 3 වන දින පැවැත්වෙන අතුරු මැතිවරණයට සතියකට මදක් වැඩි කාලයක් තිබියදී සහ ඔක්තෝබර් 27 වන දින පැවැත්වෙන ඊශ්‍රායල ජාතික මැතිවරණයට දින තුනකට පෙරය. ඇමෙරිකානු මැතිවරණයේදී ඉරාන යුද්ධයට එරෙහිව දැඩි මහජන විරෝධයක් වාර්තා වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ට්‍රම්ප්ගේ පක්ෂයට විශාල පරාජයක් හිමිවන බවට අනාවැකි පළවී ඇත. ඔක්තෝබර් 8 වන දින ප්‍රකාශයට පත් කරන ලද Pew Research Center සමීක්ෂණයකට අනුව ඇමෙරිකානුවන්ගෙන් සියයට 65 ක්ම ට්‍රම්ප් යුද්ධය මෙහෙයවන ආකාරය අනුමත නොකරන බව හෙළි විය.

ඉරානයට නැවත ප්‍රහාර එල්ල කිරීම සඳහා වන හමුදා සූදානම බෙහෙවින් ඉදිරියට ගොස් ඇත. USS Theodore Roosevelt ගුවන්යානා ප්‍රවාහන ප්‍රහාරක බලකාය සැප්තැම්බර් අවසානයේ සං දියේගෝ (San Diego) නගරයෙන් පිටත්ව ගිය අතර, ඊට දිනකට පසුව මැරීන් භටයින් 2,000 කට වැඩි පිරිසක් රැගත් ජල-භූමි (amphibious) බලකායක් පිටත් විය. නොවැම්බර් අවසානය වන විට ගුවන්යානා ප්‍රවාහන නෞකා තුනක් සහ ජල-භූමි ගොඩබෑම් බලකා (landing groups) දෙකක් ඉරානය ආසන්නයේ ස්ථානගත කරනු ඇත.

යුද්ධයට පෙර මැද-පෙරදිග ඒ වනවිටත් ස්ථානගත කර සිටි 40,000 සිට 50,000 දක්වා වූ සෙබළුන්ට අමතරව, මෙම නව ස්ථානගත කිරීම් මගින් තවත් 9,000 සිට 10,000 දක්වා භට පිරිසක් එකතු වේ. රාජ්‍ය දෙපාර්තමේන්තුව ඔක්තෝබර් 21 වන දින සවුදි අරාබියෙන් අත්‍යවශ්‍ය නොවන කාර්ය මණ්ඩල සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට ඉවත් වන ලෙස නියෝග කළ අතර, ලෙබනනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර් සහ ජෝර්දානය යන රටවල තානාපති කාර්යාලවල කාර්ය මණ්ඩලය අඩු කර ඇති බව CNN සිකුරාදා වාර්තා කළේය.

පාලනාධිකාරිය සිය යුද්ධ තීව්‍ර කිරීම සාධාරණීකරණය කිරීම සඳහා පැහැදිලි ප්‍රචාරක කථනයක් සූදානම්

කරමින් සිටී. ජාතික බුද්ධි අධ්‍යක්ෂ ටේ ක්ලේටන් විසින් රාජ්‍ය ලේකම් මාර්කෝ රූබියෝ (Marco Rubio) වෙත සිකුරාදා යවන ලද සහ Axios විසින් ප්‍රථමයෙන් වාර්තා කරන ලද සංදේශයක දැක්වුණේ, “එක්සත් ජනපද පුරවැසියන්ට එරෙහි ඉරාන ජාතිකයන්ගේ මාරාන්තික කුමන්ත්‍රණ ප්‍රයත්නයන් ඉදිරි අදියරයන්ට පැමිණ ඇති” බවයි.

කර්තෘවරුන් හයදෙනෙකුගේ නමින් සෙනසුරාදා පළ වූ ලිපියක New York Times පුවත්පත වාර්තා කළේ, “ඉරාන ජාතිකයන් මැද පෙරදිග එක්සත් ජනපද නානාපතිවරුන් සහ එක්සත් ජනපද භූමියේ සිටින ඇමෙරිකානු නිලධාරීන් ඝාතනය කිරීමට උත්සාහ කළ හැකිය” යන්න අඟවන බුද්ධි තොරතුරු කෙරෙහි එක්සත් ජනපද නිලධාරීන් අවධානය යොමු කර ඇති බවයි. එම බුද්ධි තොරතුරු “අතිශයින්ම රහසිගතව පවතින බැවින් විනිශ්චය කිරීම දුෂ්කර” බව පුවත්පත පිළිගත්තේය. “නිශ්චිත කුමන්ත්‍රණ පිළිබඳ සාක්ෂි සාකච්ඡා කිරීමෙන් එය තහවුරු කළ නොහැකි බව දැන සිටියදීත්” මෙම සංදේශය මුදා හැරීම පිළිබඳව ඇතැම් නිලධාරීන් කුතුහලයට පත්ව සිටි බවද එහි වැඩිදුරටත් සඳහන් විය. වෙනත් වචනවලින් කිවහොත්, මෙය කිසිදු පදනමක් නොමැති යුද්ධ ප්‍රචාරණයකි.

කිසිදු උත්ප්‍රාසයක සේයාවක් නොරව, Times පුවත්පත වැඩිදුරටත් සඳහන් කළේ “තෝරාගත් බුද්ධි තොරතුරු හමුදා ක්‍රියාමාර්ග සඳහා ව්‍යාජ හේතුවක් (pretext) ලෙස භාවිතා කළ හැකි ආකාරය පිළිබඳ තවත් අනතුරු ඇඟවීමේ උදාහරණයක් ඉරාකය විසින් සපයන” බවයි. ඇත්ත වශයෙන්ම, ඉරානයට එරෙහි ඉඟිකරන/වක්‍ර චෝදනා කැඳ හැලිය දෙස බලන විට, 2003 ඉරාක ආක්‍රමණයට පෙර පැවැති සහ, Times පුවත්පතද ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ, ආණ්ඩුවේ සහ මාධ්‍යවල ප්‍රචාරක ව්‍යාපාරය ඊට වඩා සංගත එකක් ලෙස පෙනී යයි.

ඇත්ත වශයෙන්ම ඝාතන පිළිබඳ ඉතිහාසයක් ඇත්තේ මෙම පදනම් විරහිත චෝදනා එල්ල කරන ආණ්ඩු වලටම වේ. එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය පෙබරවාරි 28 වන දින යුද්ධය ආරම්භ කළේ එහි මුල් පැය කිහිපය තුළදීම ඉරානයේ උත්තරීතර නායක අයතුල්ලා අලි කමේනි (Ayatollah Ali Khamenei) ඝාතනය කරමිනි.

ට්‍රම්ප් පාලනාධිකාරිය සූදානම් වන්නේ කුමකටද? එක්සත් ජනපද හමුදාව විසින් “සියලු බෝම්බවල මෑණියන්” (mother of all bombs) ලෙස හැඳින්වෙන GBU-43 බෝම්බය ඉරානයට හෙළීම ඇතුළත් නව ප්‍රහාරක සැලසුම් සකස් කර ඇති බව CNN ඔක්තෝබර් 15 වන දින වාර්තා කළේය.

ට්‍රම්ප් ටෙහෙරානයට “සියලු බෝම්බවල මෑණියන්” වන බෝම්බය හෙළීමට සැලසුම් කරන්නේද? ට්‍රම්ප් න්‍යෂ්ටික ආයුධ භාවිතා කරයිද? ඔහු පාබල හමුදා යොදවනු ඇද්ද? එක්සත් ජනපදයේ දිගු දුර මිසයිල සහ ගුවන් ආරක්ෂණ මිසයිල තොග විශාල වශයෙන් ක්ෂය වී ඇති පූර්ණ පරිමාණ ගුවන් බෝම්බ හෙළීමකින් පසුව, ට්‍රම්ප් ඉරානය “අවසන් කිරීමට” බලාපොරොත්තු වන්නේ කෙසේද?

ට්‍රම්ප් සිය තර්ජන ක්‍රියාත්මක කරන්නේද නැද්ද යන්න කිසිවෙකුට කිව නොහැක, නමුත් එම තර්ජනම බලාපොරොත්තු සුන් වීමේ ලක්ෂණයකි. මාස අටක යුද්ධය සහ වැටලීම් මගින් ඉරාන ආණ්ඩුව පෙරළා දැමීම, ඉරාන හමුදාව පරාජය කිරීම හෝ හෝමුස් සමුද්‍ර සන්ධිය නැවත විවෘත කිරීම යන ට්‍රම්ප්ගේ ඉලක්ක සපළ කරගෙන නොමැත. නමුත් යුද්ධයේ ගැඹුරු වන අර්බුදය එක්සත් ජනපද අධිරාජ්‍යවාදය තවදුරටත් විශාල සූදුවක් දෙසට තල්ලු කරමින් සිටී.

ට්‍රම්ප්ගේ අපරාධකාරී යුද ඉලක්කයන්ට මග පාදා දීම සඳහා ඩිමොක්‍රටික් පාක්ෂික යෝ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරති.



එක්සත් ජනපද නාවික හමුදාවට අයත් USS Dwight D. Eisenhower ගුවන්යානා ප්‍රවාහන නෞකාව සහ USNS Supply නම් වේගවත් යුධ ආධාරක නෞකාව 2023 දෙසැම්බර් 14 වන දින හෝමුස් සමුද්‍ර සන්ධිය (Strait of Hormuz) තරණය කරයි. [ඡායාරූපය: නාවික හමුදා දෙවන පන්තියේ පෙටී ඔෆිසර් කීත් නොවැක්]

ඩිමොක්‍රටික් පාක්ෂිකයින් යුද්ධය ගැන කතා කරන තාක් දුරට, ඔවුන් වැඩි වශයෙන් කතා කරන්නේ ඉන්ධන මිල කෙරෙහි එහි ඇති බලපෑම ගැන මිස සිදුවෙමින් පවතින දේ සහ එහි අපරාධකාරී ස්වභාවය ගැන නොවේ. ඩිමොක්‍රටික් පාක්ෂිකයින්ගේ සැබෑ උත්සුකය වන්නේ රුසියාවට එරෙහි යුද්ධයේදී මෙන්ම ඉරානයට එරෙහි යුද්ධයේදීත් ඇමෙරිකානු අධිරාජ්‍යවාදයේ අවශ්‍යතා සුරක්ෂිත කිරීමට ට්‍රම්ප් අපොහොසත් වී තිබීමයි.

ඉරිදා CBS නාලිකාවේ “Face the Nation” වැඩසටහනේදී තම “නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ඩිමොක්‍රටික් පාක්ෂිකයින්ගේ සටන්කාමී සභාපති” ලෙස හඳුන්වා ගත් කොලරාඩෝ හි ඩිමොක්‍රටික් නියෝජිත ජේසන් ක්‍රෝ (Jason Crow) ප්‍රකාශ කළේ “ඉරානය තවදුරටත් තර්ජනයක් ලෙස පවතින” බවයි. ආරක්ෂක ලේකම් පීට් හෙග්සෙත් (Pete Hegseth) “අසමර්ථ අයෙකු බවත්, අපගේ හමුදා

සාමාජිකයින් ආරක්ෂා කිරීමට අවශ්‍ය දේ නොකරන" බවත් ක්‍රෝ පැවසීය.

රුසියාව සහ යුක්‍රේනය අතර අර්ථ විරහිත "බලශක්ති සටන් විරාමයක්" ට්‍රම්ප් විසින් ඔක්තෝබර් 11 වන දින ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, සෙනෙට් සභාවේ ඩිමොක්‍රටික් නායක චක් ෂූමර් (Chuck Schumer) ඔක්තෝබර් 17 වන දින X හි සටහන් කළේ "මැද පෙරදිග එක්සත් ජනපද හමුදාවන් ඉලක්ක කිරීමට ඉරානයට උපකාර කළ ඒකාධිපතියෙකුට ට්‍රම්ප් උදව් හා අනුබල දෙන" බවයි.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සන්නද්ධ සේවා, විදේශ කටයුතු සහ බුද්ධි තොරතුරු පිළිබඳ කාරක සභාවල ප්‍රමුඛ ඩිමොක්‍රටික් සාමාජිකයින් වන ඇඩම් ස්මිත් (Adam Smith), ග්‍රෙගරි මීක්ස් (Gregory Meeks) සහ ජිම් හයිමිස් (Jim Himes) ඔක්තෝබර් 20 වන දින පොරොන්දු වූයේ යුක්‍රේනයට "ආරක්ෂක, ආර්ථික සහ බුද්ධිමය සහයෝගය" ලබා දීමට ට්‍රම්ප්ට "බලකරන" පනතක් ඉදිරියට ගෙන යන බවයි.

එක පැත්තකින් බලන කල, ඩිමොක්‍රටික් පාක්ෂිකයින් කැමති වනු ඇත්තේ ඊළඟ කොංග්‍රස් මණ්ඩලය රැස්වීමට පෙර ට්‍රම්ප් මෙම ප්‍රහාරය දියත් කරන්නේ නම් ය. ඩිමොක්‍රටිකයන් යුද්ධයට සහාය දක්වද්දී , **ඔවුන්ගේ පාක්ෂික පදනම ඊට දැඩි ලෙස විරුද්ධ වන අතර,** මැතිවරණයට පෙර හෝ ඊට ආසන්නව ඊට පසුව ට්‍රම්ප් විසින් අණ කරනු ලබන ප්‍රහාරයක් මගින්—මැද පෙරදිග බලය පිහිටුවීම සහ යුක්‍රේනය තුළ රුසියාවට එරෙහි යුද්ධය තීව්‍ර කිරීම යන—තමන්ද පොදුවේ පිළිගන්නා යුද අරමුණු සහිත යුද්ධයක දේශපාලන වගකීමෙන් මිදීමට ඔවුන්ට අවස්ථාව ලැබේ.

ඩිමොක්‍රටික් පාක්ෂිකයින්ගේ ප්‍රචාරණ ව්‍යාපාරයේ යුදකාමී ස්වභාවය තහවුරු වූයේ, ඩිමොක්‍රටික් සෙනෙට් අපේක්ෂක අබ්දුල් එල්-සයීඩ් (Abdul El-Sayed) වෙනුවෙන් ඩෙට්‍රොයිට් හි පැවැති ජනරැලියකට, CNN විසින් ඉරිදා "ඩිමොක්‍රටික් පක්ෂයේ' සමාජ්ත කරන්නා (ඡන්ද ව්‍යාපාරය කූටප්‍රාජ්ත කරන්නා) ලෙස හඳුන්වා දුන් හිටපු ජනාධිපති බරැක් ඔබාමා (Barack Obama) සෙනසුරාදා සහභාගී වීමෙනි.

"මාස හතකට පසු, ඒ යුද්ධය සිදුවන්නේ කෙසේද?" ඔබාමා ඩෙට්‍රොයිට් හිදී ඇසීය. "අපගේ මිසයිල තොග අන්තරායකාරී ලෙස පහත වැටී ඇත. තවද ප්‍රධාන කාරණය නම්, හෝමූස් සමුද්‍ර සන්ධිය සම්බන්ධයෙන් ඉරානයට දැන් නිෂේධ බලයක් (veto power) හිමිව තිබීමයි ... එබැවින් යුද්ධය ආරම්භ වීමට පෙර පැවැති තත්වයට වඩා ශක්තිමත් මූලෝපායික ස්ථානයක ඔවුන් දැන් ඉන්නවා."

ඔබාමා යනු ඇමෙරිකානු ඉතිහාසයේ, රට යුදයක යෙදී පවතිද්දී පූර්ණ ධුර කාල දෙකක් සේවය කළ එකම ජනාධිපතිවරයා වන අතර, ඔහුගේ පාලනාධිකාරය අවම වශයෙන් රටවල් හතක හමුදා මෙහෙයුම් සිදු කළේය. "ත්‍රස්තයට එරෙහි යුද්ධය" යටතේ නීති විරෝධී ලෙස ඝාතනය කිරීම සඳහා වූ "ඝාතන ලැයිස්තුවට" (kill list) එකතු කරන ලද සෑම නමක්ම ඔබාමා පෞද්ගලිකව අනුමත කළ අතර, විමර්ශනාත්මක මාධ්‍යවේදීන්ගේ කාර්යාංශය (Bureau of Investigative Journalism) මගින් ඔබාමාගේ ධුර කාල දෙක තුළ පාකිස්ථානය, සෝමාලියාව සහ යේමනය යන රටවල එක්සත් ජනපද ප්‍රහාර 563 ක් (එයින් වැඩි ප්‍රමාණයක් ඩ්‍රෝන ප්‍රහාර) වාර්තා කර ඇත. මෙය ජෝර්ජ් ඩබ්. බුෂ් (George W. Bush) යටතේ සිදු වූ ප්‍රහාර මෙන් දස ගුණයකි.

ඔබාමාව හඳුන්වා දෙමින් "ප්‍රගතිශීලී" සෙනෙට් අපේක්ෂක එල්-සයීඩ්, "අප දැවැන්තයින්ගේ කර මත සිට ගනිමු" යැයි ප්‍රකාශ කරමින් හිටපු ජනාධිපතිවරයා සමඟ සම්පූර්ණයෙන්ම එකඟ විය.

2012 නොවැම්බර් මාසයේදී, එල්-සයීඩ් විසින් ඔබාමාව විවේචනය කළේ ඔහු "යුද්ධය පවත්වාගෙන ගිය, අපගේ සිවිල් නිදහස උල්ලංඝනය කළ, සහ වෙනත් කිසිදු ජනාධිපතිවරයෙකුට වඩා වැඩි පිරිසක් අපගේ රටෙන් පිටුවහල් කළ" අයෙකු ලෙසයි. ඔක්තෝබර් 11 වන දින NBC හි "Meet the Press" වැඩසටහනේදී එම විවේචනය ගැන විමසූ විට එල්-සයීඩ් පැවසුවේ: "මා වඩා ඉලන්දාරි කාලේ එම ලිපි ලියූ නැනැත්තා — එවිට මා නාඹරයි" යනුවෙනි.

ඩිමොක්‍රටික් පාක්ෂිකයින්ට යුද්ධයට එරෙහි මහජන විරෝධය යනු ජයගත යුතු ගැටලුවකි. එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතයේ වෙනස් කල්ලි නියෝජනය කරන ට්‍රම්ප් සහ ඩිමොක්‍රටික් පාක්ෂිකයින් යන දෙපිරිසම, මැද පෙරදිග සිට නැගෙනහිර යුරෝපය සහ ආසියාව දක්වා එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ කොල්ලකාරී අරමුණු හඹා යාමට තීරණය කර ඇත.

අධිරාජ්‍යවාදී යුද්ධයේ ගෝලීය පුපුරා යෑම මගින් නිර්මාණය කර ඇති සාමාජික හා ආර්ථික අර්බුදය, කම්කරුවන් සහ තරුණයින් අතර දැවැන්ත මහජන විරෝධයක් නිර්මාණය කරමින් තිබේ. සෙනසුරාදා ප්‍රංශය පුරා 410,000 ක ජනතාවක් විරෝධතා පාගමනක නිරත වූහ.

"තරුණයින්ගේ සහ කම්කරුවන්ගේ ගෝලීය කැරැල්ල සහ පාලක පන්තියේ යුද උන්මාදය" යන මැයෙන් ඔක්තෝබර් 23 වන දින World Socialist Web Site කර්තෘ මණ්ඩලය නිකුත් කළ ප්‍රකාශය, මහජන විරෝධතා සහ යුද උත්සන්නිය "ලෝක ධනවාදයේ එකම අර්බුදයේ" නිෂ්පාදන ලෙස හඳුනා ගත්තේය. උද්ධමනය, සමාජ සුබසාධන වැඩසටහන් කප්පාදු කිරීම සහ ඩොලර් බිලියන සිය ගණනක් යුද්ධයට යොමු කිරීම යනු පැරිසියේ මෙන්ම එක්සත් ජනපදයේද ජීවන කොන්දේසි වේ.

සමීක්ෂණවල වාර්තා වන විරෝධයට තවමත් සංවිධානාත්මක ස්වරූපයක් නොමැත. යුද්ධයට එරෙහි අරගලය, පක්ෂ දෙකෙන්ම ස්වාධීනව, වේතන සහ රැකියා පිළිබඳ අරගලය යුද්ධයට සහ එය නිර්මාණය කරන ධනපති ක්‍රමයට එරෙහි අරගලයට සම්බන්ධ කරමින් කම්කරු පන්තියේ වර්ධනය වන ව්‍යාපාරය සමඟ ඒකාබද්ධ කළ යුතුය.

[අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි]

තරුණයින්ගේ සහ "කහ කබාකාරයින්ගේ" දැවැන්ත බලමුලු ගැන්වීම ප්‍රංශ රජය සොලවයි

WSWS වාර්තාකරණ කණ්ඩායම.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* ඔක්තෝම්බර් *18* දින *"Mass mobilisation of youth and "Yellow Vests" shakes the French government"* යන හිසින් පළවූ ලිපියේ සිංහල පරිවර්තනය යි.

ද්විතීයික පාසල් (high school) ශිෂ්‍ය ව්‍යාපාරයට එල්ල කෙරෙන මර්දනයට සහ ඉහළ යන බලශක්ති ගාස්තු හා ජීවන වියදමට එරෙහිව ඊයේ ප්‍රංශය පුරා අතිවිශාල ජනකායක් විරෝධතාවල නිරත වූහ. ද්විතීයික පාසල් සිසුන් සමූහ වශයෙන් අත්අඩංගුවට ගැනීමට සහ පොලිසිය විසින් ඔවුන්ට සිදු කරන ලද තුවාල කිරීම්වලට එරෙහිව කෝපය ඇවිලී යද්දී, විරෝධතාකරුවන් සහ පොලිසිය අතර ගැටුම් ඇති විය. බොහෝ නගරවල පැමිණී අතිවිශාල විරෝධතාකරුවන් හමුවේ පොලිසිය අසරණ විය.

ඊයේ රාත්‍රී අගභාගයේදී, ප්‍රංශ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මෙන්ම අන්තර්-වෘත්තීය සමිති සන්ධානය විසින් ගණන කරන ලද විරෝධතාකරුවන්ගේ සංඛ්‍යාව, ප්‍රංශය පුරා 400,000 සිට 550,000 දක්වා ඉහළ දමමින් සිය තක්සේරුව සංශෝධනය කළේය. පැරිස් නුවර විරෝධතාකරුවන් 110,000 ක් ද, මොන්පෙලියර් හි 35,000 ක් ද, ටූලූස් හි 32,000 ක් ද, නැන්ට්ස් සහ ලියොන් හි 20,000 බැගින් ද සිටි බව එය වාර්තා කළේය. ප්‍රදේශයේ සංවිධායකයින් වාර්තා කළේ ලිල් හි 80,000 ක් ද, රෙනස් සහ කාන් හි 30,000 බැගින් ද, ස්ට්‍රාස්බර්ග් හි 20,000 ක් ද, බ්‍රෙස්ට් සහ බෙසන්කොන් හි 10,000 බැගින් ද, සහ සමස්ත ප්‍රංශය පුරා 800,000 ක ජනතාවක් එකතු වී සිටි බවයි.

මෙම සංඛ්‍යාලේඛන තවමත් සැබෑ තත්ත්වයට වඩා අඩුවෙන් දක්වන්නකි. බෝඩෝ හි, ප්‍රාදේශීය පරිපාලනය විසින් විරෝධතාකරුවන් 7,000 ක සංඛ්‍යාවක් ඉදිරිපත් කළ අතර CGT (වෘත්තීය සමිති සන්ධානය) 100,000 ක් ගණනය කළේය. මාර්සෙයි හි ද ඊට සමාන සංඛ්‍යාවක් සහ පැරිස් නුවර සිය දහස් ගණනක් විරෝධතා දැක්වූහ. නිවාස අර්බුදය සම්බන්ධයෙන් ස්පාඤ්ඤයේ මිලියන ගණනක ජනතා විරෝධතා සිදුවෙද්දී සහ බෙල්ජියම, පෘතුගාලය හා අයර්ලන්තය යන රටවල සමාජ කප්පාදුවලට එරෙහිව දැවැන්ත වැඩවර්ජන පැවැත්වෙද්දී, ඊයේ ප්‍රංශයේ විරෝධතාවලට එක්වූ පිරිස සැකයකින් තොරව මිලියන ගණනක් විය.



2026 ඔක්තෝබර් 17 වන දින ප්ලාස් ඩි ලා රෙපුබ්ලික් වටා ඇති වීදි විරෝධතාකරුවන්ගෙන් පිරී පැවති අයුරු

මැක්‍රොන් බලයෙන් පහ කිරීමටත්, සමාජ කප්පාදුව සහ යුරෝපයේ යුද්ධ උත්සන්න කිරීම නතර කිරීමටත් මහා වැඩවර්ජනයක් මෙතෙක් සිදුව නැත්තේ සටන් කිරීමට ඇති කැමැත්ත නොමැතිකම නිසා නොවේ. එය වෘත්තීය සමිති නිලධාරිවාදයේ සහ ජෝන්-ලුක් මෙලෙන්ෂොන්ගේ (Jean-Luc Mélenchon) 'ලා ෆ්‍රාන්ස් ඉන්සුමීස්' (La France Insoumise) වැනි ඔවුන්ගේ දේශපාලන මිත්‍රයින්ගේ විරෝධය සහ කඩාකප්පල්කාරී ක්‍රියා හේතුවෙනි. අන්තර්-වෘත්තීය සමිති සන්ධානය නොවැම්බර් 5 වන දිනට නියම කර ඇත්තේ එක් දින ක්‍රියාමාර්ගයක් පමණි. ඒ, පන්ති අරගලයේ වර්ධනය පමා කිරීමට සහ කම්කරුවන් හා අප්‍රසාදයට පත් ප්‍රංශ රජය අතර විප්ලවවාදී ගැටුමක් ඇතිවීම වැළැක්වීමේ උත්සාහයක් ලෙසයි.

ප්‍රධානතම කාර්යය වන්නේ නිලධාරි තන්ත්‍රය විසින් වැළැක්වීමට උත්සාහ කරන මහා වැඩවර්ජනය සූදානම් කිරීම සඳහා, වෘත්තීය සමිති උපකරණවලින් ස්වාධීනව ක්‍රියාකාරී කමිටු තුළ කම්කරු පංතිය සංවිධානය කිරීම සහ සූදානම් කිරීමයි. කෙසේ වෙතත්, දැනටමත් තත්ත්වය රාජ්‍ය යන්ත්‍රණය

සමඟ කෙරෙන ගැටුමක් බවට පත්වෙමින් තිබේ. විරෝධතාකරුවෝ ලිමෝජ් නගර සභාව ගිනිබත් කළහ, මාර්සෙයි සහ ලිල් නගර සභාවලට කඩා වැදුණහ, සහ බෝඩෝ හි පොලිස් ප්‍රධානියාගේ නිල නිවසට කඩා වැදුණහ. ටූලූස් සහ මෙට්ස් නගර සභා දෙසට මෙන්ම පැරිසියේ එලිසි (Elysée) මාළිගාව දෙසට ගමන් කළ පාගමන් පොලිසිය විසින් ආපසු හරවා යවන ලදී.

රජයේ සහ පාර්ලිමේන්තු පක්ෂවල නායකයින් සියලු දෙනාම, තම තමන්ගේ ආකාරයෙන් මෙම ව්‍යාපාරය පිළිබඳ බිය සහ විරෝධය ප්‍රකාශ කර ඇත. “අවුල් වියවුල් වපුරන අයට එරෙහිව අපි සියලු දෙනාම එකට සිටගන්නෙමු” යි මැක්‍රොන් පොරොන්දු විය. රිපබ්ලිකන් පක්ෂය (LR) වෙනුවෙන් බෘනෝ රෙටායෝ (Bruno Retailleau), විරෝධතාවල පැවැති “පෙර නොවූ විරූ තීව්‍රතාවය” හෙළා දුටු අතර, “රාජ්‍යයේ නොපසුබට බලය” සහ විරෝධතාකරුවන්ට “සිරදඬුවම්” දෙන ලෙස ඉල්ලා සිටියේය.

මෙලෙන්ෂොන් (Mélenchon) සිය මිලියන සංඛ්‍යාත ඡන්දදායකයින් සහ කම්කරුවන් මහා වැඩවර්ජනයක් සහ විප්ලවවාදී අරගලයක් සඳහා බලමුලු ගන්වන ලෙස ඉල්ලා නොසිටියි. X හි සටහනක් තබමින් ඔහු පැවසුවේ “පොලිසිය නොමැති විට සෑම තැනකම අතිවිශාල පිරිසක්, ඉතා සන්සුන්ව සහ ප්‍රීතියෙන්” සිටින බවයි. සියල්ලටම වඩා, පොලිස් මර්දනය මගින් “අවුල් වියවුල් සඳහා දොරටු විවෘත කර ඇති බවට” පැමිණිලි කළ ඔහු, “කොල්ලකෑම් සහ විනාශ කිරීම්” හෙළා දුටු අතර, “දේශපාලන අර්ථයක් නැති සහ අපගේ ක්‍රමවේදයන්ට පටහැනි ක්‍රියාමාර්ගවලට සහභාගී වීම අප ප්‍රතික්ෂේප කළ යුතුය” යි අවධාරණය කළේය.

නව-ෆැසිස්ට්වාදී නැෂනල් රැලි (RN) පක්ෂය වෙනුවෙන් මරීන් ලෙ පෙන් (Marine Le Pen), “අති-වාමාංශිකයන් විසින් ප්‍රාණ ඇපයට ගෙන ඇති” සහ “රට අවුල් ජාලයකට හෙළීමට උත්සාහ කරන” විරෝධතා හෙළා දුටුවාය. **සැබවින්ම, ඊයේ සිදු වූ දැවැන්ත බලමුලු ගැන්වීම, ප්‍රංශයේ සහ යුරෝපය පුරා ප්‍රධාන ධාරාවේ මාධ්‍ය විසින් “අති-වාමාංශිකයන්” ලෙස හඳුන්වන සංවිධානවල නායකයින්ගේ කුමන්ත්‍රණයක් නොවේ. එය අරගලය හරහා ඒ සංවිධානවලින් මිදීමට කම්කරුවන් සහ තරුණයන් දැරූ උත්සාහයකි.**

පැරිසියේදී, ද්විතික පාසල් විරෝධතාකරුවන් සමූහ වශයෙන් අත්අඩංගුවට ගැනීම සහ ඔවුන් අඩපණ කිරීමට එරෙහිව තමන්ගේ ඇති විරෝධය, විශේෂයෙන්ම බලශක්ති ගාස්තු ඇතුළු ඉහළ යන බඩු මිල පිළිබඳ කෝපය, සහ පුළුල් ලෙස යුද්ධයට, පොලිස් රාජ්‍යයට හා ධනපති කතිපයාධිකාරයට (oligarchy) එරෙහි තමන්ගේ විරෝධය ගැන විරෝධතාකරුවෝ WSWS වෙත පැවසූහ. ඇල්ජීරියානු නිදහස් යුද්ධය පැවැති සමයේ, 1961 ඔක්තෝබර් 17 වන දින පැරිස් පොලිසිය විසින් ඇල්ජීරියානු විරෝධතාකරුවන් සමූලඝාතනය කිරීම සලකුණු කිරීම සඳහා බොහෝ විරෝධතාකරුවෝ ඇල්ජීරියානු ජාතික කොඩිය රැගෙන සිටියහ.



ඔගස්ටින් *(Augustin)*

“කහ කබාකාරයෙකු” සහ පාපැදි අලුත්වැඩියා කරන්නෙකු වන ඔගස්ටින් පැවසුවේ තමා ද්විතීක පාසල් සිසුන්ට සහය පල කිරීමට සහ ආර්ථික අසමානතාවයට එරෙහිව විරෝධතාවල නිරත වන බවයි: “මැක්‍රොන්ගේ අවුරුදු 10 ඇතුළත, සාමාන්‍ය ප්‍රංශ ජාතිකයෙකුගේ වේතනයේ ක්‍රය ශක්තිය (මිලදී ගැනීමේ හැකියාව) සියයට 4 කින් 5 කින් අඩුවෙලා තියෙනවා. ඒත් බර්නාඩ් අර්නෝ (Bernard Arnault) තමන්ගේ වත්කම හතර ගුණයකින් වැඩි කරගෙන තියෙනවා. **අපි දැක්කේ ඉතා දකුණාංශික ලිබරල් ප්‍රතිපත්තියක්.** හාම්පුතුන්ගේ දායකත්වයන් අවුරුදු 10 ක කාලය තුළ අඩුම මට්ටමට අඩුවෙලා. ධන බද්ද අහෝසි කළා. කෝටිපතියන්ගෙන්, සාපේක්ෂව, අපෙන් අය කරනවාට වඩා අඩුවෙන් බදු අය කරන්නේ.”

විශේෂයෙන්ම රුසියාවට සහ ඉරානයට එරෙහි යුද්ධ හේතුවෙන් තෙල් සහ ගෑස් සැපයුම් අඩාල වී මිල ගණන් අහස උසට ඉහළ යන පසුබිමක, යුද්ධයට එරෙහි සිය විරෝධය ඔගස්ටින් අවධාරණය කළේය: “අපි යුද්ධය සමනය කළ යුතුයි, ඒ වගේම හමුදාවේ ප්‍රමාණය අඩු කළ යුතුයි, අපේ සන්නද්ධ බලකායන් අඩු කළ යුතුයි, මොකද... අපේ අරමුණ ලෝක සාමය ඇති කිරීම නම්, ඒක හමුදා සම්පත් වැඩි කිරීමෙන් සිදු වෙන්නේ නැහැ.”

2027 ජනාධිපතිවරණයේදී මෙලෙන්ෂොන් පත්වීම මගින් යම් වෙනසක් සිදුවනු ඇතැයි තමා බලාපොරොත්තු වන බව පැවසූ ඔහු, මෙලෙන්ෂොන්ගේ පාලනය බලාපොරොත්තු කඩ කළහොත් තමන් වීදි බසින බව පැවසීය: “මෙලෙන්ෂොන් අපිට ද්‍රෝහී වුණොත්, අපි දස ගුණයක ශක්තියෙන් පාරට බහිනවා. මොකද ඇත්තටම, ඔහු අපේ අවසාන බලාපොරොත්තුව... මට නම්, මෙලෙන්ෂොන් කියන්නේ එක් අධියරක් විතරයි, අවසාන අරමුණ නෙවෙයි. ඒක ඇත්තටම අවසානය නෙවෙයි.”


ශිෂ්‍යයෙකු වන ඊතන් (Ethan) මෙසේ පැවසීය: “ජාතික අධ්‍යාපන පද්ධතිය සම්පූර්ණයෙන්ම කඩා වැටෙමින් තියනවා. ප්‍රංශයේ කම්කරුවන්ට නරක ලෙසට සලකන්නේ. ප්‍රාග්ධනය — අපි ප්‍රාග්ධනයට විශාල තෑගි දෙන අතරේ ශ්‍රමයට වටිනාකමක් දෙන්නේ නැහැ. මධ්‍යම පංතිය සහ කම්කරු පංතිය දැඩි ලෙස පීඩාවට පත්වෙනවා. ඒක අවමානයක්, ඒ නිසයි අපි මෙතනට ආවේ, අපිට මේක එපා කියලා කියන්න.” ඔහු තවදුරටත් මෙසේ පැවසීය, “මම වෘත්තීය සමිති එක්ක

සම්බන්ධ නැහැ, මට තොරතුරු නැහැ, ඒත් මම හිතන්නේ ඒක නින්දා සහගතයි. බලය සහ සංවිධානාත්මක සම්පත් තියෙන වෘත්තීය සමිතිවලට වඩා වේගයෙන් ජනතාවට තමන්ම සංවිධානය වෙන්න පුළුවන් වෙලා තියෙනවා."



ආතර් *(Arthur)*

ආතර් (Arthur) ලොරේන් හි කුරුසය (Cross of Lorraine) සහිත කොඩියක් රැගෙන ගියේ ප්‍රංශ



කොලින් *(Coline)*

ස්වෝත්තමවාදයෙන් නොව, ෆැසිස්ට් විරෝධය සහ ප්‍රතිරෝධී (Resistance) ව්‍යාපාරයේ මතකයට වාමාංශික අන්තර්ගතයක් ලබා දීම සඳහාය: "ලොරේන් හි කුරුසය කියන්නේ නිදහස් ප්‍රංශයේ, ඒ කියන්නේ 1940 ගණන්වල නාසීන්ට සහ ෆැසිස්ට්වාදීන්ට එරෙහිව සටන් කළ 'ප්‍රතිරෝධය' ව්‍යාපාරයේ සංකේතයයි. අද, හොලෝකොස්ට් (යුදෙව් සමූලඝාතනය) නැතැයි කියන පිරිස් විසින් මෙම සංකේතය කෙලෙසනවා අපි දකිනවා. මෙම සංකේතය නැවත අත්පත් කර ගැනීම වැදගත්; එය ෆැසිස්ට් විරෝධයේ ශක්තිමත් සංකේතයක් ලෙස පවතිනවා... මම උත්සාහ කරන්නේ ඊට නැවත වාමාංශික අන්තර්ගතයක් දෙන්න."

කොලින් (Coline) WSWS වෙත මෙසේ පැවසුවාය: "මම ද්විතීක පාසල් ශිෂ්‍යාවක්, මම මෙතන ඉන්නේ සියලුම අවාසිදායක තත්ත්වයන්හි පවතින ද්විතීක පාසල්වලට සහය දක්වන්න. උද්ධමනය, ඩීසල් මිල, ප්‍රංශයේ සෑම දෙයකම මිල ඉහළ යාම, සහ අපගේ පෙර බලමුලු ගැන්වීම්වලට එල්ල වූ පොලිස් මර්දනය යන සියල්ල සමග අරගලයන් එකිනෙක බද්ධ වීමක් මෙතන තියෙනවා. ... බලයේ සිටින රජය ඉවත් විය යුතුයි, මොකද ඒක හොඳ රජයක් නෙවෙයි, ඒක ජනතාවට ඇහුම්කන් දෙන්නේම නැහැ."

දෙවන ලෝක යුද්ධ සමයේ නාසීන් සමග සහයෝගයෙන් කටයුතු කළ ආඥාදායක පේටන්ගේ (Pétain) නම සඳහන් කරමින්, ඇගේ පුවරුවේ ආණ්ඩුව "පේටන්ගේ බල්ලන්" ලෙස හඳුන්වා තිබූ බව WSWS පෙන්වා දුන් විට, කොලින් පිළිතුරු දුන්නේ: "පැහැදිලිවම" යනුවෙනි. ප්‍රතිරෝධී ව්‍යාපාරය (Resistance) යනු ප්‍රධාන වශයෙන්ම කම්කරු පංතිය මත පදනම් වූ යුරෝපීය කැරලිකාර ව්‍යාපාරයක් වූ බවත්, යුරෝපය සහ ලෝකය පුරා ජාත්‍යන්තර ව්‍යාපාරයක් වර්ධනය වෙමින් පවතින බවත්, එය නැවත වරක් මහා වැඩවර්ජනයකට සහ විප්ලවවාදී අරගලයකට මග පාදන බවත් WSWS මතක් කර දුන්නේය. කම්කරුවන්ගේ ජාත්‍යන්තර විප්ලවවාදී බලමුලු ගැන්වීමේ ඉදිරිදර්ශනයට තමා එකඟ වන බව කොලින් පැවසුවාය.

වත්මන් ව්‍යාපාරය ගැන ඇය මෙසේ පැවසුවාය, "මෙය සමාජ පංති මට්ටමේ ව්‍යාපාරයක් ද වෙනවා, මොකද බලද්දී, දැන් අති-ධනවතුන් ඉන්නවා, ජනගහනයේ අනිත් කොටස් එක්ක බලද්දී ප්‍රංශයේ ඔවුන් කවදාවත් මෙච්චර ධනවතුන් වෙලා නැහැ. ඒ නිසා මෙය ද්විතීක පාසැල් සමාජ ව්‍යාපාර විතරක් නෙවෙයි, සමාජ පංති අරගලයක් ද විය යුතුයි. අපි අති-ධනවතුන්ට සහ බිලියනපතියන්ට එරෙහිව ද කැරලි ගැසිය යුතුයි. ඒ නිසා



2026 ඔක්තෝබර් *17* වන දින *8,000* කට ආසන්න පිරිසක් පාගමනින් ගිය ඇමියන්ස් *(Amiens)* හි තරුණයින් බලමුලු ගැන්වීම.

ඔව්, මෙය පෙර පැවැති ප්‍රතිරෝධී ව්‍යාපාරය හා දැඩි ලෙස දේංකාර දෙනවා, මොකද මෙය කම්කරු පංතියේ ව්‍යාපාරයක් විය යුතුයි."

ඇය තවදුරටත් මෙසේ පැවසුවාය, **"ඒ නිසා විප්ලවයක් වෙනවාට මම කැමතියි, සැබෑ විප්ලවයක් — ඒක ටිකක් සැර වැඩි ඇති — ඒත් සෑම දෙයක්ම පෙරළනවාට, අපිට අලුත් ක්‍රමයක් ලැබෙනවාට මම කැමතියි."**

ප්‍රංශයේ ද්විතීක පාසල් ව්‍යාපාරයේ සහ යුරෝපය පුරා කම්කරුවන්ගේ හා තරුණයන්ගේ දැවැන්ත බලමුලු ගැන්වීම් මගින් එවැනි ප්‍රතිඵලයකට මග

දිවුලපතාන ඉඩම් ආරවුල: වාර්ගික ගැටුමක් නොව පන්තිමය ප්‍රශ්නයකි



2026 ඔක්තෝබර් 5 වන දින සිංහල ගොවීන් වගා කළ භූමිවලට ගවයන් මුදා හැරීම

සංජය ජයසේකර විසිනි.

මෙම ලිපිය *"The Divulapathana Land Dispute: A Class Question, Not an Ethnic Conflict"* යන හිසින් theSocialist.lk හි ඉංග්‍රීසි බසින් *2026* ඔක්තෝම්බර් *7* දින පළ විණි.

ඉඩකලපුව සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක අතර පිහිටි මයිලත්තමඩු, මාධවනයි සහ දිවුලපතාන මායිම් තීරුවල උග්‍ර වෙමින් පවතින ඉඩම් ආරවුල දැඩි අර්බුදකාරී තත්වයකට ළඟා වී තිබේ. දෙමළ ගව පාලන පවුල්, තම ගවයන් සඳහා සාම්ප්‍රදායිකව භාවිතා කළ තණබිම් නැවත ලබා දෙන ලෙසත්, රාජ්‍ය අනුග්‍රහය ලබන සිංහල පදිංචිකරුවන්ගේ (settlers) ප්‍රචණ්ඩත්වය අවසන් කරන ලෙසත් ඉල්ලමින් දින 1100 කට වැඩි කාලයක් තිස්සේ අඛණ්ඩ, සාමකාමී විරෝධතාවයක නිරත වී සිටිති. ඔවුන්ගේ ඉල්ලීම්වලට කිසිදු සවන්දීමක් සිදු වී නොමැත. පදිංචිකරුවන් විසින් මරණීය තර්ජන එල්ල කර, ගොවීන්ට පහර දී, සංවිධානාත්මක ලෙස ගවයන් එම ඉඩම්වලින් පලවා හැර ඇත. ගිනිඅවි, උගුල් සහ පුපුරණ ද්‍රව්‍ය (හක්ක පටස්) යොදා ගනිමින් පශු සම්පත ඉලක්ක කර සැලසුම්සහගතව සිදු කළ පහරදීම් නිසා බහුල ලෙස ගවයන් ඝාතනය විය — 2020 නත්තල්-පෙර දින සිදු කළ මහා පරිමාණ ඝාතනය ද ඊට ඇතුළත් ය. මෙය ප්‍රදේශයේ කිරි නිෂ්පාදනය අඩපණ කරමින් ජීවනෝපායන් විනාශ කර දැමීය. විරෝධතා, ප්‍රාදේශීය අධිකරණවලින් නිකුත් වූ ඉවත් කිරීමේ නියෝග සහ ජාත්‍යන්තර මානව හිමිකම් වාර්තාකරණයන් පැවතිය ද, ක්ෂේත්‍ර මට්ටමේ නීතිය ක්‍රියාත්මක කිරීම දුර්වල මට්ටමක පැවති අතර, ඉඩම් අල්ලා ගැනීම් ගැන වාර්තා කිරීමට උත්සාහ කළ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් රාජ්‍ය බලධාරීන් විසින් ප්‍රශ්න කිරීමට ලක් කර ඇත.

සඳුදා (5) දිවුලපතාන ගම්මානයේදී, ප්‍රාදේශීය දෙමළ පාර්ලිමේන්තු මන්ත්‍රී ශානක්‍යන් රාසමාණික්කම්ගේ (Shanakiyan Rasamanickam) පෙලඹවීම මත සිදු වූවක් යැයි කියනු ලබන, ඊට පෙර දින කරන ලද තර්ජනයක් ක්‍රියාත්මක කරමින්, දෙමළ ගව පාලකයෝ සිංහල ගොවීන් වගා කළ ඉඩම් වෙත ගවයන් 2,000 ක් පමණ මුදා හැරියෝය. මෙම සිදුවීම අර්බුදය ගමන් කරමින් පවතින දිශාව පිළිබඳ අනතුරු ඇඟවීමකි: එනම්, යටින් පවතින ඉඩම් ප්‍රශ්නය විසඳීමට කිසිදු උනන්දුවක් නොමැති දෙපාර්ශ්වයේම බලවේග විසින් සැලසුම් සහගතව නිර්මාණය කරනු ලබන විවෘත ජනවාර්ගික ගැටුමක් දෙසට ය.

පාදමින් සිටී. ධනපති ආණ්ඩු ඔවුන්ගේ පැත්තෙන් යුද්ධය, මර්දනය හෝ ආඥාදායකත්වයේ නැගීම නතර කරන්නේ නැත. ප්‍රංශයේ, ධනපති පන්තිය ඒ වෙනුවට මර්දනය තීව්‍ර කරන බවට පොරොන්දු වෙමින් සිටින අතර, ඊයේ පැවැති විරෝධතාවලදී පමණක් පොලිසිය විසින් පුද්ගලයින් 2,000 කට වැඩි පිරිසක් අත්අඩංගුවට ගෙන ඇති අතර ව්‍යාපාරය ආරම්භ වූ තැන් සිට 8,000 කට ආසන්න පිරිසක් අත්අඩංගුවට ගෙන ඇත. සෙන්ට්-එටියන් (Saint-Étienne) හිදී පොලිස් අත්බෝම්බයක් නිසා විරෝධතාකරුවෙකුගේ අතක් වෙන් වී ගිය අතර, ඊයේ මර්දනයේ සමස්ත හානිය තවමත් අනාවරණය වී නොමැත.

1968 මැයි මාසයේදී මෙන්, මහා වැඩවර්ජනයක් පිළිබඳ පූර්ව අපේක්ෂාව විරෝධතාකරුවන් අතර එකහෙළා පාහේ පිළිගැනීමට ලක්ව ඇත. එවැනි ව්‍යාපාරයක් දැන් සූදානම් කළ යුතු අතර, එයින් පැනනගින විප්ලවවාදී කාර්යයන් සඳහා කම්කරු පංතිය සූදානම් කළ යුතුය. ප්‍රංශයේ සහ යුරෝපයේ සෙසු ප්‍රදේශවල දැනටමත් බලමුලු ගැන්වී ඇති තරුණයන් සහ කම්කරුවන් ක්‍රියාකාරී කමිටු තුළ එක්රැස් කිරීමත්, සේවකයින් සිටින ස්ථාන වෙත ගොස් කම්කරුවන් වඩාත් පුළුල් ලෙස බලමුලු ගන්වන ලෙස ඉල්ලා සිටීමත් මීට අවශ්‍ය වේ. කාර්යය වන්නේ අධිරාජ්‍යවාදී යුද්ධයට, කප්පාදුවලට සහ ආඥාදායකත්වයට එරෙහිව මහා වැඩවර්ජනයකින් බලමුලු ගැන්වීමයි. එයින් ධනපති කතිපයාධිකාරයෙන් බලය උදුරාගෙන එය කම්කරුවන්ට පැවරීමේ අවශ්‍යතාවය මතු කරනු ඇත.

[අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි]

නිර්මාණය කරන ලද ජනවාර්ගික ගැටුමක්

වත්මන් අර්බුදය ඕපපාතිකව මතු වූවක් නොවේ. එය දශක ගණනාවක් තිස්සේ රාජ්‍ය අනුග්‍රහය සහිතව සිදු කරන ලද ජනපදකරණ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වන අතර, මයිලත්තමඩු සහ මාධවනයි යනු එහි නවතම ගැටුම්කාරී මධ්‍යස්ථාන පමණි.

මෙම තණබිම් පිහිටා ඇත්තේ මඩකලපුව මායිමේ, මාදුරු ඔයේ අතු ගංගාවක් වන මන්දාරි ගඟ අසල ය. පරම්පරා ගණනාවක් තිස්සේ සීතාණ්ඩි, වන්දාරුමූලයි, ඉල්ලුප්පඩියච්චේනයි සහ මුරුක්කට්ටන්චෝලයි යන ප්‍රදේශවල දෙමළ ගව පාලන පවුල් විසින් ඒවා භාවිතා කර ඇත — 2023 දත්තවලට අනුව, සත්ව පාලනය එකම ජීවනෝපාය කරගත් පවුල් දහසකට වැඩි ප්‍රමාණයක් ඊට ඇතුළත් ය. 1979 තරම් පූර්වයෙදී, පොළොන්නරුව සහ මඩකලපුව දිස්ත්‍රික්ක වල පැතිරි මහවැලි අධිකාරියේ ‘බී’ කලාපය යටතේ මෙම තණබිම්වලින් අක්කර 12,000 ක් අත්පත් කර ගන්නා ලදී. 2013 සිට ඉදිරියට, අම්පාර සහ පොළොන්නරුව යන ප්‍රදේශවලින් පැමිණි සිංහල පදිංචිකරුවන් — හියුමන් රයිට්ස් වොච් (Human Rights Watch) සංවිධානයට අනුව, රජයේ සහාය ඇතිව පදිංචි කරවන ලද සහ නීති විරෝධී ගිනිඅවිවලින් සන්නද්ධ වූ විශ්‍රාමික සෙබළුන් ද ඇතුළුව — එම තණබිම් අත්පත් කර ගැනීමට පටන් ගත්හ. 2023 වන විට, තණබිම් හෙක්ටයාර 3,150 ක් පමණ තර්ජනයට ලක්ව තිබූ අතර, 2012 සහ 2023 අතර කාලය තුළ ගවයින් 6,948 ක් පමණ ඝාතනය කිරීම, තුවාල කිරීම, අතුරුදහන් කිරීම හෝ බලහත්කාරයෙන් අල්ලා ගැනීම සිදු විය.

මහවැලි අධිකාරිය සහ එකල නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරිය තණබිම්වල බඩඉරිඟු සහ රටකජු වගා කිරීමට සක්‍රීයව අනුබල දීමත් සමඟ 2020 දී අර්බුදය තීරණාත්මක ලෙස උග්‍ර විය. පොළොන්නරුවෙන් පැමිණි සිංහල බඩඉරිඟු වගාකරුවන් තණබිම් තුළ පදිංචි කරන ලද අතර, දෙමළ ජනතාවගේ ගවයන් ඝාතනය කිරීම — වෙඩි තැබීම, කඩුවලින් කැපීම, විදුලි වැටවල්වල සිරකිරීම, විදුලි සැර වැද්දවීම — සංවිධානාත්මක ස්වරූපයක් ගත්තේය. 2020 නත්තල් පෙර දින සිදු වූ ඝාතනය මෙහි වඩාත්ම කුප්‍රකට සිදුවීම පමණි. 2024 මාර්තු වන විට දෙමළ ගොවීන් වාළච්චේන පොලිස් ස්ථානයේ පැමිණිලි 36 ක් ලියාපදිංචි කර තිබූ අතර, අධිකරණයට ඉදිරිපත් කරනු ලැබ තිබුනේ පැමිණිලි තුනක් පමණි. 2021 ජනවාරි මාසයේදී අභියාචනාධිකරණය වෙත නඩුවක් ගෙන ගිය අතර, නීති විරෝධී ලෙස රැඳී සිටින්නන් 2021 පෙබරවාරි 28 වන විට ඉවත් වන බවට මහවැලි අධිකාරිය ප්‍රතිඥාවක් දුන්නේය. 2021 ජූලි 21 වන විට සියලුම හේන් වගාකරුවන්ට ඉවත් වන ලෙස අධිකරණය නියෝග කළේය. එම නියෝගය කිසි දිනෙක ක්‍රියාත්මක කර නැත. ආක්‍රමණික ලෙස ඉඩම් අල්ලා ගැනීම නතර කරන ලෙස මඩකලපුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ජනාධිපතිගෙන් ඉල්ලා සිටීමෙන් පසු නීති විරෝධී පදිංචිකරුවන් ඉවත් කිරීමට ඔහු එකඟ වූ පසුවත්, එම 2023 ඔක්තෝබර් මාසයේදීම, භික්ෂුවකගේ සහ හිටපු ආණ්ඩුකාරවරියගේ [අනුරාධා යහම්පත්] නායකත්වයෙන් ආරවුලට ලක් වූ ඉඩමේ අලුතින් බුදුපිළිමයක් තැන්පත් කරන ලදී. දෙමළ ගොවීන් දැන් 2023 සැප්තැම්බර් මාසයේ සිට — වසර 3 කට වැඩි කාලයක් තිස්සේ — අඛණ්ඩ විරෝධතාවයක් පවත්වාගෙන යන අතර, රජය ඒ වෙනුවෙන් කිසිදු පියවරක් ගෙන නොමැත.

වසර දෙකක් තිස්සේ බලයේ සිටින ජාතික ජන බලවේගයේ ආණ්ඩුව, විදේශයන්හිදී තමන් ප්‍රගතිශීලී පාලනයක් ලෙස නිරූපණය කර ගන්නා අතරම, ගොවීන් සමඟ සාකච්ඡා කිරීම හෝ පදිංචිකරුවන්ගේ ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම ප්‍රතික්ෂේප කර ඇත්තේ මෙවැනි පසුබිමකය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහාය ලත් වාර්තාවක් මගින් 2020 සහ 2024 අතර කාලය තුළ පමණක් නැගෙනහිර පළාතේ විසඳී නොමැති රාජ්‍ය-පුරවැසි ඉඩම් ආරවුල් 50 ක් හඳුනාගෙන ඇත. බෞද්ධ භික්ෂූන්ගේ සක්‍රීය අනුබලය ඇතිව, සුළුතර ප්‍රජාවන්ගෙන් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ හමුදාව යන සියල්ල යොදවා ඇති ආකාරය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (Centre for Policy Alternatives – CPA) විසින් ලේඛනගත කර ඇත.

එසේ වුවද, මෙම කෘෂිකාර්මික ඉඩම් ආරවුල ජනවාර්ගික ප්‍රශ්නයක් බවට පත් කරමින් සිටින්නේ සිංහල-ස්වෝත්තමවාදී සහ දෙමළ ජාතිකවාදී නායකයන් දෙපිරිසම විසිනි. මෙහි ඇති ප්‍රශ්නය කිරි ගොවීන්ට සහ හේන් වගාකරුවන්ට අවශ්‍ය ඉඩම් පිළිබඳ ප්‍රශ්නයකි — එය සිංහල-දෙමළ ගැටුමක් නොවේ. අදාළ ඉඩම් ගව පාලනයට සහ හේන් වගාවට යන දෙකටම අවශ්‍ය වේ: එනම්, දිළිඳු ග්‍රාමීය ශ්‍රම වගුරන ජනතාවගේ (rural toilers) කණ්ඩායම් දෙකක් විසින් එකම සම්පත සඳහා තරඟ වදින භාවිත දෙකක් පිළිබඳ ප්‍රශ්නයකි. ගව පාලකයන් බහුතරයක් දෙමළ වීමත්, වගාකරුවන් බහුතරයක් සිංහල වීමත් ප්‍රදේශයේ ඉතිහාසයේ ජනගහන විද්‍යාත්මක අහම්බයක් (demographic accident) මිස ගැටුමේ සාරය නොවේ. සාරය වන්නේ, ජලය, පොහොර, ගබඩා පහසුකම්, සත්ව ආහාර හෝ ග්‍රාමීය නිෂ්පාදනයේ කිසිදු මූලික කොන්දේසියක් සැපයීමට රාජ්‍යය අසමත් වී ඇති ධනපති අර්බුදයේ කොන්දේසි යටතේ, හිඟ කෘෂිකාර්මික ඉඩම් වෙනුවෙන් කෙරෙන අරගලයයි.

පාලක පන්තිය සහ දෙපාර්ශ්වයේම සිටින ඔවුන්ගේ වාර්ගික වාදී සහායකයන් (communalist auxiliaries) ජනවාර්ගික (ethnic) ගැටුමක් බවට පරිවර්තනය කිරීමට උත්සුක වන්නේ මෙවැනිම ආකාරයේ ආරවුල් ය. මෙම යාන්ත්‍රණය, ශ්‍රී ලංකා ඉතිහාසය පුරා හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (ICFI) ලේඛනගත කර ඇති යාන්ත්‍රණයට අත්‍ය සමාන වේ: එනම් කම්කරු පන්තිය සහ ග්‍රාමීය දිළිඳු ජනතාව තම ද්‍රව්‍යමය කොන්දේසි සම්බන්ධයෙන් රාජ්‍යයට එරෙහිව නැගී සිටින විට, ධනපති පන්තිය එම අභියෝගය වාර්ගික මාවත්වලට යොමු කරයි. මූලික හානිය සිදු කර ඇත්තේ සිංහල-ස්වෝත්තමවාදී රාජ්‍යයයි —

ඉඩම් එළිපෙහෙළි කිරීම, පශු සම්පත් ඝාතනය කිරීම, පොලිසියේ සහ අධිකරණවල අනුබලය, අත්පත් කරගත් ඉඩම්වල බුදුපිළිම තැන්පත් කිරීම, මේ සියල්ල ඊට ඇතුළත් ය. නමුත්, තම වාර්ගික පදනම තර කර ගැනීම සඳහා ගොවීන්ගේ පීඩාවන් උපයෝගී කරගන්නා දෙමළ ජාතිකවාදී දේශපාලනඥයන්ට ද ඉඩම් ප්‍රශ්නය විසඳීමට හැකියාවක් නැත, මන්ද ඔවුන් ද එය පන්ති අරගලයක් ලෙස නිරූපණය කරනවා වෙනුවට ජනවාර්ගික දුක්ගැනවිල්ලක් ලෙස රාමුගත කර ගැනීමට තදින්ම උත්සාහ කරන බැවිනි.

වාර්ගිකවාදයන් දෙක

මූලික හානිය සිදු කර ඇත්තේ සිංහල-ස්වෝත්තමවාදී රාජ්‍යය වන අතර, එය තවදුරටත් එය සිදු කරමින් සිටී. ඉඩම් එළිපෙහෙළි කිරීම, පශු සම්පත් ඝාතනය, පොලිසියේ සහ අධිකරණවල අනුබලය, අත්පත් කරගත් තණබිම්වල බුදුපිළිම තැන්පත් කිරීම — මේ සියල්ලම උතුර සහ නැගෙනහිර පුළුල් ජන සංයුතිය වෙනස් කිරීමේ (demography engineering) කොටසක් ලෙස සිංහල පදිංචිකරුවන්ට වාසි සහගත ලෙස සැලකීමට රාජ්‍යය සිය බලය යොදා ගැනීමකි. එය ගල්ඔය, මහවැලි සහ යුද්ධයෙන් පසු ඇති කළ හමුදා ජනපද වැනි ව්‍යාපෘතියක්මය. මහවැලි අධිකාරිය අභියාචනාධිකරණයට දුන් ප්‍රතිඥාව, අධිකරණයේ ඉවත් කිරීමේ නියෝගය, නීති විරෝධී පදිංචිකරුවන් ඉවත් කිරීමට දුන් ජනාධිපතිවරයාගේම එකඟතාවය — යන මේ සියල්ල ක්‍රියාත්මක නොකර අතහැර දමා ඇත්තේ, රාජ්‍යයට ඒවා ක්‍රියාත්මක කිරීමට කිසිදු අභිලාෂයක් නොමැති බැවිනි. අද සිංහල පදිංචිකරුවන්ට ඉඩම් ලබා දෙන රාජ්‍යය, ඔවුන්ගෙන් අවශ්‍ය දේශපාලන උවමනාව සම්පූර්ණ කරගත් පසු හෙට දින ඔවුන්ව අතහැර දමනු ඇත. පදිංචිකරුවන්ම ඉත්තන් වේ: ජන සංයුතිය වෙනස් කිරීමේ ව්‍යාපෘතියට සේවය කරන තාක් කල් ඔවුන්ට ඉඩම් සහ රාජ්‍ය ආරක්ෂාව හිමි වන අතර, ඔවුන් යොදාගෙන රාජ්‍යය මගින් ඇවිලවූ ගැටුම පුපුරා ගිය පසු එහි ප්‍රතිවිපාකවලට මුහුණ දීමට ඔවුන් තනි කර දමනු ලැබේ.

නමුත් දෙමළ ජාතිකවාදී දේශපාලනඥයන් ද එක හා සමානව වැරදිකරුවෝ වෙති. පාර්ලිමේන්තු මන්ත්‍රී ශානකයන් රාසමාණික්කම් විසින් ගවයන් මුදා හැරීමට පෙලඹවූයේ යැයි කියනු ලබන සිදුවීම — එනම් සිංහල ගොවීන් වගා කළ ඉඩම් මතට ගවයන් 2,000 ක් මුදා හැරීම — දෙමළ ගව පාලකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමක් නොවේ. එය වාර්ගික ආතතීන් ඇවිලවීම සඳහාත්, එමගින් දෙමළ ජාතිකවාදී පක්ෂවල දේශපාලන පදනම තහවුරු කර ගැනීම සඳහාත් සැලසුම් කරන ලද චේතනාන්විත ප්‍රකෝපකිරීමකි. ගොවීන්ගේ පීඩාවන් ඉස්මතු කරමින් “ජාත්‍යන්තර අවධානය සහ මැදිහත්වීම” — එනම් අධිරාජ්‍යවාදී බලවතුන්ගේ අනුග්‍රහය — ඉල්ලා සිටින මෙම පක්ෂවලට ඉඩම් ප්‍රශ්නය විසඳීම සඳහා කිසිදු වැඩපිළිවෙළක් නැත, මන්ද ඔවුන් ද එය පන්ති අරගලයක් ලෙස නිරූපණය කරනවා වෙනුවට ජනවාර්ගික දුක්ගැනවිල්ලක් ලෙස රාමුගත කිරීමට තදින්ම උත්සාහ කරන බැවිනි. සිංහල ධනපති පන්තියට මෙන්ම දෙමළ ධනපති පන්තියට ද ඉඩම් ප්‍රශ්නය විසඳීමට කිසිදු උනන්දුවක් නැත. දෙපිරිසටම ගැටුම පවත්වාගෙන යාම අවශ්‍ය වේ, මන්ද පන්තිමය පදනමින් විසඳීමක් සිදු වුවහොත් — එනම් ධනපති රාජ්‍යයට එරෙහිව සිංහල සහ දෙමළ ශ්‍රම වගුරන ජනතාවගේ එකමුතුව ගොඩනැගුණහොත් — එය වාර්ගිකවාදී ව්‍යාපෘතිදෙකෙහිම බංකොලොත්භාවය හෙළිදරව් කරමින්, ධනපති පන්ති දෙකෙහිම වරප්‍රසාදවලට තර්ජනයක් වන බැවිනි.

ඉඩම් ප්‍රශ්නය

මෙම ඉඩම් දෙමළ ජනතාව විසින් ගව පාලනය සඳහා සාම්ප්‍රදායිකව භාවිතා කරන ලද ඉඩම් ය. එම ඓතිහාසික



මඩකලපුවේ මයිලත්තමඩු–මාධවනයි ගම්වැසියෝ, තම ප්‍රජාවන් පරම්පරා ගණනාවක් තිස්සේ නඩත්තු වූ තණබිම් අඛණ්ඩව භාවිත කිරීමේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ආරක්ෂා කර ගැනීමේ අරගලයේ තෙවැනි සංවත්සරය සලකුණු කරමින් *2026* සැප්තැම්බර් *15* වන දින විරෝධතාවයක් පැවැත්වූහ. ඡායාරූපය *NorthEasternMonitor.lk* අනුග්‍රහයෙනි.

සත්‍යය පිළිගත යුතුය. එය දෙමළ ග්‍රාමීය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වල කොටසක් වන අතර, මහවැලි ‘බී’ කලාපීය අත්පත් කර ගැනීම් හරහා, සිංහල වගාකරුවන් පදිංචි කිරීම හරහා, පොලීසි සහ අධිකරණවල අනුබලය හරහා රාජ්‍යය එම ඉඩම්වලට ආක්‍රමණික ලෙස ඇතුළු වීම එම අයිතිවාසිකම්වලට එල්ල කරන ලද ප්‍රහාරයකි. මයිලත්තමඩු සහ මාධවනයි යන ප්‍රදේශවල දෙමළ ගව පාලකයන් “අනවසරයෙන් අතුලු වූවන්” (encroachers) නොවේ; ඔවුන් මෙම තණබිම්වල සාම්ප්‍රදායික පරිශීලකයන් වන අතර, ඔවුන්ගේ අයිතීන් අහිමි කිරීම රාජ්‍යයේ අපරාධයකි.

නමුත් දෙමළ ජනතාවට තම ජාතිකත්වය (nationality) නිසාම පමණක් ඉඩම් පිළිබඳ පූර්ණ අයිතිය හිමි වන බව ප්‍රකාශ කිරීම වැරදිය. **මාක්ස්වාදී ස්ථාවරය නිශ්චිත ය: දෙමළ ගව පාලකයන්ට තම පශු සම්පත සඳහා සාම්ප්‍රදායිකව භාවිතා කළ ඉඩම් සඳහා අනුලංඝනීය ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ඇති නමුත්, එය භාවිතයේ**

සහ ඓතිහාසික වාස භූමියේ අයිතියක් (habitation) මිස ජනවාර්ගිකත්වයෙන් ගලන බහිෂ්කාරක/ අනන්‍ය වූ හිමිකාරිත්වයේ අයිතියක් නොවේ. ඉඩම් ප්‍රශ්නය ජනවාර්ගික කෝණයකින් විසඳිය නොහැක. මෙම ඉඩම් දෙමළ තණබිම් ලෙස පමණක් ගැසට් කරන ලෙස දෙමළ ජාතිකවාදීන් කරන ඉල්ලීමත්, එය සිංහල පදිංචිකරුවන්ට විවෘත කරන ලෙස සිංහල ස්වෝත්තමවාදීන් කරන ඉල්ලීමත් එකම ප්‍රතිගාමී කාසියක දෙපැත්තයි. දෙපාර්ශ්වයම සැබෑ ආර්ථික ප්‍රශ්නය වෙනුවට ජනවාර්ගික හිමිකම් ආදේශ කරති: එනම්, කිරි ගොවීන් සහ හේන් වගාකරුවන් අතර ඉඩම් බෙදා හරින්නේ කෙසේද, සහ දෙපිරිසේම නිෂ්පාදන අවශ්‍යතා සපුරාලන්නේ කෙසේද යන්නයි.

පුරාවිද්‍යාත්මක ස්ථාන සහ ජනපදකරණ යෝජනාක්‍රම සඳහා ද අදාළ වන්නේ මෙම මූලධර්මයමය: ඓතිහාසිකව පීඩාවට පත් වූ ජනතාවකට තමුන්ගේ සාම්ප්‍රදායික ඉඩම් (traditional lands) සහ ජනාවාස ප්‍රදේශ (neighbourhoods) සඳහා ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අනුලංඝනීය වේ. නමුත් එම අයිතිය ජනවාර්ගික බහිෂ්කාරකත්වයේ/පරම හිමිකම් පෑමක් නොවන අතර දෙමළ ජාතිකවාදීන්ගේ [සිංහල ස්වෝත්තමවාදයට එරෙහිව පිහිටුවන] ප්‍රතිබිම්බමය වාර්ගිකවාදය (mirror-image communalism) හරහා එය ඉදිරියට ගෙන යා නොහැක. **තණබිම් අහිමි වූ දෙමළ ගව පාලකයා සහ ජලය සහ පොහොර අහිමි වූ සිංහල වගාකරු එකම පද්ධතියේ ගොදුරු වේ. අනෙකාගේ සහයෝගයෙන් මිස දෙදෙනාගෙන් කිසිවෙකුටත් තමුන්ගේ ජීවනෝපාය තහවුරු කර ගත නොහැක.** ඉඩම් ප්‍රශ්නයට විසඳුම ඇත්තේ දෙපාර්ශ්වයේම වාර්ගිකවාදීන් (communalists) විසින් නිර්මාණය කරන ලද ජනවාර්ගික තරඟය තුළ නොව, [සම්පත්] හිඟය නිර්මාණය කර පසුව එය සූරා කෑ ධනපති රාජ්‍යයට එරෙහිව ප්‍රජාවන් දෙකෙහිම ශ්‍රම වගුරන ජනතාවගේ පොදු අරගලය තුළ ය.

ඉදිරි මාවත

ආණ්ඩුවට හෝ සිංහල ස්වෝත්තමවාදීන්ට හෝ දෙමළ වාර්ගිකවාදීන්ට මෙම ප්‍රශ්නය නිවැරදි ආකාරයෙන් දැකීමට හෝ විසඳීමට හැකියාවක් නැත. විසඳුම ඇත්තේ වාර්ගික සීමාවන්ගෙන් ඔබ්බට ගොස් ග්‍රාමීය ශ්‍රම වගුරන ජනතාවම ස්වාධීනව සංවිධානය වීම තුළ ය.

පළමුව, කෘෂිකාර්මික ඉඩම් සාධාරණ ලෙස බෙදා හැරීම සඳහා සාකච්ඡා කිරීමට සිංහල සහ දෙමළ ගොවීන්ගේ ස්වාධීන කමිටු — රාජ්‍යය හෝ වාර්ගිකවාදී පක්ෂ නොවේ—ඉදිරිපත් විය යුතුය. **සැබෑ ආර්ථික ආරවුලට විසඳුම් සෙවිය හැකි එකම යාන්ත්‍රණය මෙයයි, මන්ද ගොවීන් සතුරු ජනවාර්ගික ප්‍රජාවන්ගේ සාමාජිකයන් ලෙස නොව පොදු අභිලාෂයන් සහිත නිෂ්පාදකයන් ලෙස එකිනෙකා හමුවන එකම යාන්ත්‍රණය එය වන බැවිනි.** නමුත් සැබෑ ලෙසම මෙම කමිටු යනු මොනවාදැයි තේරුම් ගත යුතුය: එනම් හුදෙක් තාවකාලික සාකච්ඡා-කේවල් කිරීමේ මණ්ඩප හැටියට නොව, ජනතා බලයේ කළල ස්වරූපයේ ස්වාධීන සංවිධාන ලෙසය. ඒවා තුළ, ශ්‍රම වගුරන ජනතාව ධනපති රාජ්‍යයට සහ එහි වාර්ගිකවාදී යාන්ත්‍රණයට පිටතින් සහ ඊට එරෙහිව තමුන් වෙනුවෙන් කෙළින්ම බලය යෙදවීමට—සාකච්ඡා කිරීමට, තීරණය කිරීමට සහ ක්‍රියා කිරීමට—පටන් ගනිති.

මෙය සෝවියට් (Soviet) රූපයේ ප්‍රාථමික, නොදියුණු ප්‍රකාශනයයි: එනම් පාලක පන්තිය විසින් වගා කරන ජනවාර්ගික සහ ආගමික බෙදීම් කපා හරිමින්, නව රාජ්‍ය බලයක බීජය අන්තර්ගත කරන, සූරා කෑමට ලක්වූවන්ගේ ස්වයං-සංවිධානය වීමයි. 1917 රුසියානු විප්ලවයේ කේන්ද්‍රීය පාඩම වන “සියලු බලය සෝවියට් සභාවලට” (“all power to the soviets”) යන මූලධර්මයෙන් අදහස් වන්නේ හරියටම මෙයයි: එනම් ධනපති රාජ්‍යය නොව, කම්කරු පන්තියේ සහ ශ්‍රම වගුරන ජනතාවගේ ස්වාධීන සංවිධාන ව්‍යුහයන් දේශපාලන බලයේ පදනම විය යුතුය. ඉඩම්, ජලය, පොහොර, ගබඩා පහසුකම්, සත්ව ආහාර සහ යහපත් ජීවන තත්වයන් සඳහා ආණ්ඩුවට එරෙහිව අරගලයේදී එක්සත් වූ සිංහල සහ දෙමළ ගොවීන්ගේ කමිටු, එම අරමුණ කරා යන පළමු පියවරයි. ඒවායේ වර්ධනය —ගමෙන් දිස්ත්‍රික්කයට, පිටිසරින් නගරයට ඒවා ව්‍යාප්ත වීම, කාර්මික කම්කරු පන්තියේ ස්වාධීන කමිටු සමඟ ඒවා ඒකාබද්ධ වීම—යනු ගොවි ප්‍රශ්නය සහ ජාතික ප්‍රශ්නය විසඳිය හැකි මාවතයි. තම ස්වාධීන සංවිධාන තුළ සංවිධානය වූ ශ්‍රම වගුරන ජනතාවන් දේශපාලන බලය තම අතට ගත් විට පමණක් ඉඩම් ප්‍රශ්නය ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී පදනමක් මත විසඳා ගත හැකි අතර, එය සූරාකන වර්ගවාදී දේශපාලනය අවසාන වශයෙන් අහෝසි කළ හැකිය.


දෙවනුව, අවශ්‍ය පහසුකම්—ජලය, පොහොර, ගබඩා පහසුකම්, සත්ව ආහාර සහ යහපත් ජීවන තත්වයන්—සඳහා ගොවීන් [ගව පාලකයන්ද ඇතුළු] ධනපති ආණ්ඩුවට එරෙහිව පොදු අරගලයක් ගෙන යා යුතුය. **ඉඩම් ආරවුල යනු අවසාන වශයෙන් කෘෂිකර්මාන්තයේ නිෂ්පාදන බලවේග වර්ධනය කිරීමට රාජ්‍යය අසමත් වීම සහ ඉඩම් වාර්ගිකවාදී දේශපාලනයේ මෙවලමක් ලෙස භාවිතා කිරීමේ ප්‍රතිඵලයකි. ගොවීන්ගේ සැබෑ සතුරා එකිනෙකා නොව, හිඟය නිර්මාණය කර පසුව එය සූරා කෑ ධනපති රාජ්‍යයයි.** සිංහල සහ දෙමළ ශ්‍රම වගුරන්නන්ගේ එකමුතුව ගොඩනඟනු ලබන්නේ ස්වෝත්තමවාදීන් විසින් නිර්මාණය කරන ලද වාර්ගික තරඟය නොව—මෙම අරගලයයි. මන්ද, ප්‍රජාවන් දෙකෙහිම ගොවීන් තමුන්ගේ අභිලාෂයන් සමාන බව ප්‍රායෝගිකවම සොයාගන්නේ තම පොදු පීඩකයාට එරෙහි සටනේදී පමණි: එනම් තණබිම් අහිමි වූ දෙමළ ගව පාලකයා සහ ජලය සහ පොහොර අහිමි වූ සිංහල වගාකරු එකම පද්ධතියේ ගොදුරු බවත්, අනෙකාගේ සහයෝගයෙන් මිස දෙදෙනාගෙන් කිසිවෙකුටත් තමුන්ගේ ජීවනෝපාය තහවුරු කර ගත නොහැකි බවත් ය. ස්වාධීන කමිටු යනු මෙම සොයාගැනීමේ මෙවලමයි. ඒවා හරහා ගොවීන් තම පොදු ඉල්ලීම් සූත්‍රගත කළ යුතුය, තම පොදු ක්‍රියාමාර්ග සංවිධානය කළ යුතුය, සහ එක්සත් බලවේගයක්

ලෙස රාජ්‍යයට මුහුණ දිය යුතුය—ඒ, ආණ්ඩුවේ, සිංහල ස්වෝත්තමවාදීන්ගේ හෝ දෙමළ ජාතිකවාදී පක්ෂවල වාර්ගිකවාදී ප්‍රකෝපකිරීම්වලින් බෙදී ගැනීම ප්‍රතික්ෂේප කරමින් ය.

තෙවනුව, කම්කරු පන්තිය ගොවීන්ට සහයෝගය දිය යුතු අතර නායකත්වය ගත යුතුය. ගොවි ප්‍රශ්නය සහ ජාතික ප්‍රශ්නය ගොවිජනතාවට හෝ සුළු-ධනපති පන්තියට පමණක් විසඳිය නොහැක. ඒවා විසඳිය හැක්කේ සමාජවාදී වැඩපිළිවෙළක් මත ග්‍රාමීය ශ්‍රම වගුරන ජනතාව මෙහෙයවමින් කම්කරු පන්තිය විසින් දේශපාලන බලය ලබා ගැනීම සඳහා කරනු ලබන අරගලය හරහා පමණි. ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායේ (Trotsky's Theory of Permanent Revolution) හරය මෙයයි: එනම් ඉඩම් ප්‍රශ්නය සහ ජාතික ප්‍රශ්නය ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී කාර්යයන් විසඳීමට ධනපති පන්තියට ඵෙයින්ද්‍රියවම හැකියාවක් නැත, එබැවින් මෙම කාර්යයන් පැටවෙන්නේ කම්කරු පන්තිය මතට ය.

කම්කරු පන්තිය දේශපාලන බලය සඳහා—කම්කරු හා ගොවි ආණ්ඩුවක් පිහිටුවීම සඳහා—සටන් කළ යුතුය; මන්ද, ඉඩම් ප්‍රශ්නය, ජාතික ප්‍රශ්නය සහ අනෙකුත් සියලුම ප්‍රජාතන්ත්‍රවාදී කාර්යයන් විසඳිය හැක්කේ රාජ්‍ය බලය අත්පත් කර ගැනීමෙන් පමණක් බැවිනි. ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (Socialist Lead of Sri Lanka and South Asia – SLLA), theSocialist.lk සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (ICFI) ඉදිරිපත් කරන ඉදිරිදර්ශනය මෙයයි: එනම් කම්කරු හා ගොවි ආණ්ඩුවක්, සියලුම ප්‍රජාවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ, උතුර සහ නැගෙනහිර ඉඩම් ආරවුල් සහ ඒවා ගසාකන වාර්ගිකවාදී දේශපාලනය අවසාන වශයෙන් විසඳිය හැකි එකම පදනම ලෙස සමාජය සමාජවාදී ලෙස පරිවර්තනය කිරීම.

SLLA POLITICAL GRAPHICS






RELEASE GNANASARA
OUR RELIGIOUS LEADER
ගලගොඩ අත්තේ ඥානසාර
BBS
Buddhist Sangha Protects Our Nation
The Sangha's march is a demand for power—not justice.
The Buddhist hierarchy is not defending a monk. It is asserting its claim to be a co-governing authority of the capitalist state—demanding that the law, equality before it, and every democratic right of the Tamil and Muslim minorities be subordinated to its interests.
This is the politics of fascism:
a privileged social layer demanding the state bend to its supremacy.
Workers of all communities—Sinhala, Tamil, Muslim—unite and defeat this fascist threat!
theSocialist.LK | SLLA


සිරුවැරයාට නිදහස
BBS
බෞද්ධ බල සේනා
The government won't ban Sihala Ravaya.
It needs them.
Gotabaya's own Presidential Commission recommended proscribing this chauvinist, Sinhala-Buddhist extremist outfit.
The government refuses to act.
Why?
Because these fascist forces are its reserve army. They are already doing the state's work—entrenching the division of the working class along communal lines, setting Sinhala workers against their Tamil and Muslim brothers and sisters. And the government and the trade union bureaucracies have artificially suppressed the workers' struggles, knowing the explosion is coming. When it erupts, they will deploy these gangs against it.
Workers, defeat the real enemy!
theSocialist.LK | SLLA


ඥානසාර හිමිට නිදහස
BBS
බෞද්ධ බල සේනා
වර්ගවාදී "සිංහල රාවය" නම් සිංහල-බෞද්ධ අන්තවාදී සංවිධානය තහනම් කිරීමට ආණ්ඩුව කටයුතු නොකරනු ඇත. ආණ්ඩුවට ඔවුන් අවශ්‍ය කර තිබේ.
ගෝඨාගේ ජනාධිපති කොමිෂන් සභාව විසින් ම මෙම ස්වෝත්තමවාදී සිංහල-බෞද්ධ අන්තවාදී කල්ලිය තහනම් කරන ලෙස නිර්දේශ කරන ලදී. එහෙත් ආණ්ඩුව එය ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කරයි.
ඇයි?
මන්ද යත්, මෙම ෆැසිස්ට් බලවේග ආණ්ඩුවේ සංචිත හමුදාව (reserve army) වන බැවිනි. කම්කරු පන්තිය වාර්ගිකවාදී පදනමින් බෙදා වෙන් කරමින්, සිංහල කම්කරුවන් ඔවුන්ගේ දෙමළ සහ මුස්ලිම් සහෝදර සහෝදරියන්ට එරෙහිව මෙහෙයවමින්, රාජ්‍යයේ කාර්යභාරය ඉටු කිරීමට ඔවුහු දැන්මමත් කටයුතු කරමින් සිටිති. ආණ්ඩුව සහ වෘත්තීය සමිති නිලධරය විසින් කම්කරු අරගල කෘත්‍රිම ලෙස යටපත් කර ඇත්තේ, එහි පුපුරා යාම වැළැක්වීමු නොහැකි බව දන්නා බැවිනි. එම අරගල පුපුරා යන විට, මෙම කල්ලි ඒවාට එරෙහිව යොදවනු ඇත.
කම්කරුවනි, සැබෑ සතුරා පරාජය කරනු!
theSocialist.LK | SLLA


Buddhist Sangha Protects Our Nation
සංඝ සංස්ථාවේ පාගමන බලය සඳහා කෙරෙන ඉල්ලීමකි; එය යුක්තිය උදෙසා වන්නක් නොවේ.
බෞද්ධ ධුජාවලිය මෙහිදී ආරක්ෂා කරන්නේ එක් භික්ෂුවක් නොවේ. එය ධනපති රාජ්‍යයේ සම-පාලන බලධාරියෙකු ලෙසට පත් වීමේ තම අයිතිය ප්‍රකාශ කර සිටියි — එනම් නීතිය, නීතිය ඉදිරියේ සමානතාවය, සහ දෙමළ හා මුස්ලිම් සුළුතර ජාතීන්ගේ සැම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකමක්ම තමන්ගේ සියලු අභිලාෂයන්ට යටත් කළ යුතු යැයි ඉල්ලා සිටියි.
මෙය පැහැදිලිවම ෆැසිස්ට්වාදී දේශපාලනයයි: එනම් එක් වරප්‍රසාදිත සාමාජික ස්ථරයක් විසින් රාජ්‍යය තමන්ගේ ආධිපත්‍යයට යටත් විය යුතු බවට කරන තර්ජනාත්මක බලපෑමයි.
සිංහල, දෙමළ, සහ මුස්ලිම් සියලු ජන වර්ගවල කම්කරුවනි — එකවමු, මෙම ෆැසිස්ට් තර්ජනය පරාජය කරමු!
theSocialist.LK | SLLA



The Sangha's protests are not a fight for the workers— they are a fascist trap.

The monks demanding a presidential pardon for Gnanasara are not opposing the JVP/NPP government from the left. This is an ultra-right opposition to a right-wing government— a faction of the ruling class maneuvering to capture the impending class struggles and channel them behind a fascist force.

The working class must see the trap.

Neither the chauvinist Sangha nor the austerity-enforcing government defends the interests of the workers and the oppressed. Both are enemies.

Workers must mobilize against both—

and fight for power to defeat IMF austerity and the building of a police state.



theSocialist.LK | SLLA



ත්‍රස්තවාදයට එරෙහිව සටන් කරන බවට කළ ප්‍රකාශයන්ට පටහැනිව, ගලගොඩඅත්තේ ඤාණසාර සහ සිංහල ස්වෝත්තමවාදීන් සිදු කළේ ත්‍රස්තවාදය සක්‍රියව පෝෂණය කිරීමයි — එනම්, 2019 පාස්කු ඉරිදා බෝම්බකරුවන් බලමුලු ගැන්වීම සඳහා සහරාන් හෂීම් විසින් ආයුධයක් කරගත් මුස්ලිම් විරෝධී වෛරයේ සහ හිංසනයේ සරු පස නිර්මාණය කිරීමයි.

මෙය 2021 ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාවේ සොයාගැනීමයි.

ස්වෝත්තමවාදීන් අන්තවාදයට එරෙහිව සටන් කළේ නැත; ඔවුන් කළේ එය බෝ කිරීම සහ පෝෂණය කිරීමයි.

SLLA | theSocialist.LK



මාක්ස්වාදය, භූ දේශපාලනය හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් නිර්මිත ආවර්ධිත බුද්ධියේ නව යෙදුම
Socialism AI වෙතින් අසන්න. SocialismAI.com වෙත පිවිසෙන්න.

Socialism AI ඔබගේ දෛනික දේශපාලන අධ්‍යාපනයේ හා ක්‍රියාකාරකම්වල කොටසක් කර ගැනීමට අපි අපගේ සියලුම පාඨකයින්ට ආරාධනා කරමු.

සියල්ල රඳා පවතින්නේ අප කරන දේ මත ය. සමාජවාදය සඳහා සටනට සංවිධානය සහ දේශපාලන ඉදිරිදර්ශනය අවශ්‍ය වේ. කම්කරුවෝ පීඩිත ජනතාවට හා තරුණයින්ට නායකත්වය සැපයිය යුතු අතර විප්ලවවාදී පක්ෂයෙන් මෙහෙය වනු ලැබිය යුතුය. ධනවාදය නැවත වරක් මානව වර්ගයා ප්‍රශ්න පිළිබඳ ප්‍රශ්නයට යොමු කරයි: එනම් සමාජවාදය ද, මිලේච්ඡත්වය ද යන ප්‍රශ්නයයි.

අප ජීවත් වන්නේ පන්ති සමාජයක ය. එහි කම්කරු පන්තියේ පැත්ත ගන්න. ලෝකය යහපත් ලොවක් බවට පරිවර්තනය කළ හැක්කේ කම්කරු පන්තියේ නායකත්වය යටතේ එම පන්තිය ද, සෙසු පීඩිත ජනතාව ද එක්සත් කිරීමෙන් පමණි. ඒ සඳහා එහි ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා එහි ශාඛා ගොඩනගන්න. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගොඩ නැගීමේ අරමුදලට සහාය දෙන්න. ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සහ වැඩසටහනෙන් කම්කරු පන්තිය සන්නද්ධ කිරීමේ සටනට සහාය දෙන්න. ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) සමග එක් වන්න.

The Socialist සඟරාව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප/SEP) විප්ලවවාදී වාම කන්ඩායම වන **ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය** (SLLA) හි ඩිජිටල් මාසික ප්‍රකාශනයයි. එහි සියලු කලාප download කර ගැනීමට මෙහි පිවිසෙන්න: https://www.thesocialist.lk/monthly-magazine/. මෙහි පළකරනු ලබන සියලු ලිපි පිළිබඳ ඔබගේ අදහස් හා සාකච්ඡා සඳහා අපව සම්බන්ධ කර ගැනීමට අපට ලියන්න: socialistlead@gmail.com. අපගේ වෙබ් අඩවිය **theSocialist.lk** නිති පතා කියවන්න. **The Socialist World** YouTube නාලිකාවේ විවරණ අසන්න. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) ලෝක ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය wsws.org දිනපතා කියවන්න. සසප යනු ICFI හි ලංකා ශාඛාවයි. එසේම, කම්කරු පන්තියේ නායකත්වය ගොඩනැගීමේ අපගේ අරගලයට එකතු වන්න. **theSocialist.lk** සඳහා මුදලින් දායක වන්න.

ලංකාවේ එකම සමාජවාදී සඟරාව, The Socialist ඩිජිටල් කලාප ඔබගේ හිතවතුන් අතර බෙදා හරින්න. සඟරාව WhatsApp හරහා ලබා ගැනීමට 0777497101 වෙතින් ඉල්ලුම් කරන්න.

World Socialist Web Site WSWS.ORG

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපි දිනපතා කියවන්න